# පාලි භාෂාව

# 10 ශ්‍රේණිය

## ගුරු අත්පොත
(2015 සිට ක්‍රියාත්මක වේ)



සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පාලි භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 10 වැනි ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : **w.w.w.nie.lk**

විද්‍යුත් තැපැල : **info@nie.lk**

පාලි භාෂාව

ගුරු මාර්ගෝපදේශය

10 වැනි ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : w.w.w.nie.lk

**විද්‍යුත් තැපැල** : info@nie.lk

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වු අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වු කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතන සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

2015 වර්ෂයේ විෂයමාලා ප්‍රතිසංවිධානය යටතේ විදේශ හා සම්භාව්‍ය භාෂා සඳහා ගුරු මාර්ගෝපදේශ හඳුන්වාදීමට ලැබීම ඉතා සතුටට කරුණකි. වර්තමානයේ දී, ජාත්‍යන්තරය සහ ගෝලීයකරණය තුළ විදේශ භාෂා සඳහා හිමි වන්නේ සුවිශේෂ වැදගත්කමකි. විවිධ සමාජ මට්ටම් තුළ විවිධ භාෂාවල භාවිතය, ඉතා සීමිත භාෂා කිහිපයක පවත්නා භාෂාත්මක අධිරාජ්‍යවාදය මුලිනුපුටා දමයි.

වර්තමානයේ දී, ශ්‍රී ලාංකිකයන් තුළ භාෂා ඉගෙන ගැනීම සඳහා ඉතා විශාල ඉල්ලුමක් සහ උනන්දුවක් පවතියි. 2015 වර්ෂයේ දී චීන, රුසියන් සහ කොරියන් යන භාෂා ද සාමාන්‍ය පෙළ විෂයමාලාවට ඇතුළත් වී ඇති හෙයින් ශිෂ්‍යයන්ට ජපන්, ජර්මන්, ප්‍රංශ, හින්දී, පාලි, සංස්කෘත සහ අරාබි යන විෂයයන්ට අමතර ව ඉහත භාෂා ද හැදෑරීමේ අවස්ථාව උදාවනු ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයේ සඳහන් එක් එක් නිපුණතාවන් අත්පත් කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව ගුරුවරයාට මග පෙන්වීමක් කර ඇත. ඒ අනුව විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් අනුව වඩා හොඳ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට හිමි වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා දායකත්වය ලබාදුන් බාහිර සම්පත් පුද්ගල කණ්ඩායමට ද මෙම පොත සකස් කිරීමේ වගකීම දැරූ ව්‍යාපෘති නායක සහ ඒ සඳහා සහාය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තුතිය හිමි වේ.

**නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්**
**විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය විශේෂඥ උපදේශනය - මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි.
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය.

විෂය සම්බන්ධීකරණය - රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති
පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි. (සහකාර කථිකාචාර්ය)
ජාතික අධ්‍යාපන ආයතනය,

ලේඛක මණ්ඩලය -

අභ්‍යන්තර ලේඛක මණ්ඩලය

01. පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි (සහකාර කථිකාචාර්ය)
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, (විශිෂ්ට පන්ති) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, (විශිෂ්ට පන්ති) පශ්චාත් උපාධි උපදේශන ඩිප්ලෝමා, අධ්‍යාපනපති)

බාහිර ලේඛක මණ්ඩලය

02 පූජ්‍ය විහාර බුලංකුලමේ උපවංස හිමි (පාලි ගුරු උපදේශක)
(ශාස්ත්‍රවේදී (ගෞරව) අධ්‍යාපන ඩිප්ලෝමා, අධ්‍යාපනපති.)

03 ඒ.එම්.එස්. ජයවීර ( විශ්‍රාමික අධ්‍යක්ෂ)
ශාස්ත්‍රපති (ඉතිහාසය ) ශාස්ත්‍රපති (සිංහල) ශාස්ත්‍රපති (බෞද්ධ අධ්‍යයනය) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,

04. ආර්. ඒ. විමල් ප්‍රේමතිලක මයා, (පාලි විෂය උපදේශක)
ශාස්ත්‍රවේදී (ගෞරව) ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)

05 කේ. ඒ. සුමිත් ධර්මශ්‍රී මයා (පරිවෙණාචාර්ය)
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)

06 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලීල් අධිකාරි
(පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා,
රාජකීය පණ්ඩිත, ශ්‍රී.ලං.අ.ප.සේ. II, කලාභූෂණ සම්මානලාභී)

07 ඩී.ඒ.එම්.එස් දිසානායක( පරිවෙණාචාර්ය )
(ශාස්ත්‍රවේදී (ගෞරව) ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා)

පරිගණක වදන් සැකසුම ආර්. ඒ. විමල් ප්‍රේමතිලක මයා, (පාලි විෂය උපදේශක)

පිටකවරයේ චිත්‍ර නිර්මාණය ඩී.එම්.ප්‍රසාදිකා මධුෂාණි මෙනවිය,
සංවර්ධන නිලධාරි, කොළඹ මහනගර සභාව

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ඔස්සේ නිපුණතා පාදක විෂයමාලාවක් පාසල් පද්ධතියට හඳුන්වා දී ඇත. ඒ අනුව නව පාලි විෂය නිර්දේශය ද, නිපුණතා පාදකව සකස් කර ඇත. ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී සිදුවේ. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍ය වනුයේ සිසු විභවතා මතුකර ගැනීමට සමත් උද්‍යෝගිමත් ගුරු භූමිකාවක් නිර්මාණය කිරීම පිණිසය. මෙම අධ්‍යාපන ක්‍රමයේ දී දරුදැරියන්ගේ චින්තන කුසලතාව මෙන් ම පුද්ගල කුශලතාව ද සමාජ හා ආචාර විද්‍යාත්මක සංවර්ධනය ද අපේක්ෂිත ය.

බෞද්ධ දර්ශනය සම්පූර්ණයෙන් ම නිපුණතා පාදක වූවකි. එම දර්ශනය ඇතුළත් ත්‍රිපිටකය ලියවී ඇති භාෂාව පාලි භාෂාවයි. එකී ත්‍රිපිටකයෙහි පුද්ගලයාගේ මෙලොව පරලොව සුභසිද්ධියට හේතුවන දේශනා සමුදායක් ඇත. ඒවා ඇසුරින් පාසල් සිසුන්ගේ චින්තන කුශලතා, පුද්ගල කුශලතා, සමාජ කුශලතා හා ආචාර විද්‍යාත්මක කුශලතා ද ගොඩනැගීමේ අරමුණෙන් පාසල් තුළ පාලි භාෂාව ඉගැන්වීම කළ යුතුවේ. ඒ වෙනුවෙන් සැකසුණු නිපුණතා පාදක විෂය නිර්දේශයට අනුව මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය කොට ඇත. එහි දී විෂය භාර ගුරු භාවතා විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කොට ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදිය යුතු වේ.

10 ශ්‍රේණිය සඳහා නිපුණතා අටක් හා ඒ ඒ නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් විෂය නිර්දේශයේ ඇතුළත් වේ. එහි 1 සිට 6 දක්වා නිපුණතා පාලි භාෂාව හා සම්බන්ධ ව්‍යාකරණ පිළිබඳ අවබෝධය සිසුන් තුළ ඇති කරවයි. 7, 8 යන නිපුණතා තුළින් ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය කිරීමේ නිපුණතාව ද, ජීවිතයේ විවිධ අවස්ථාවල පාලි භාෂාව ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද ශිෂ්‍යයා තුළ ඇති කරයි. නිර්දිෂ්ට ග්‍රන්ථ මගින් ගුරුවරයා මෙන් ම ශිෂ්‍යයා ද ඒ කෙරෙහි යොමු කොට ඇත. පන්ති කාමර අධ්‍යාපනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ද මෙහි දී යොදාගත යුතු අතර තාක්ෂණික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ද භාවිතයට ගත යුතුය. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථකව සිදුවන්නේ දැයි සොයා බැලීම ගුරුවරයාගේ ප්‍රධාන වගකීමක් වන අතර එහි දී තක්සේරුව හා ඇගයීම ගුරුවරයාට ප්‍රයෝජනවත් වේ. පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතුය. එමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය මෙන් ම ගුරු සිසු අන්‍යෝන්‍ය සබඳතාවය ද තහවුරු වේ. ගුරු මාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරුව හා ඇගයීම හොඳින් කියවා අවබෝධ කරගෙන, ඒ අනුව වාරයකට ඇගයීම් ආධාරක දෙක බැගින් සකසා සිසු සාධනය ඇගයීමට ලක් කරන්න.

නිපුණතා හා නිපුණතා මට්ටම් කෙරෙහි සැළකිලිමත් වෙමින් විෂය අන්තර්ගතය කෙරෙහි දැඩි අවධානය යොමු කොට අපේක්ෂිත ඉගෙනුම් පල පාඩම් අවසානයේ දී ශිෂ්‍යයා තුළින් ප්‍රකටවන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුක්ත විය යුතුය. සෑම ඒකකයකට ම යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් දක්වා ඇත. පන්ති කාමරයට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරුභවතාට මෙහිදී නිදහස හිමිවේ. මෙහි කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැළකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නොඉක්මවන පරිදි නිපුණතාවලට වෙන්කර ඇති කාලච්ඡේද ප්‍රමාණ සංශෝධනය කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. එසේ ම බොහෝ විට කාල සටහන් සැකසීමේදී එක විට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන බැවින්, ඊට සුදුසු පරිදි පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීම කි.

විෂය නිර්දේශයේ ඇතුළත් නිපුණතාවලට අදළ විෂය අන්තර්ගතය ඇසුරින් නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී ඉගෙනුම් පල අත්පත් කරගත යුතු අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරු ස්වාධීනත්වය අනුව නිර්මාණත්මකව සිදුකරගත යුතුය.

රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි.
ව්‍යාපෘති ප්‍රධාන

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| I | අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය | iii |
| II | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවිඩය | iv |
| 01 | විෂයමාලා කමිටුව | v |
| 02 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 03 | පටුන | vii |
| 04 | විෂය නිර්දේශය | viii-xxi |
| 04 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | xx-xxii |
| 05 | පාලි වර්ණ මාලාව 1 | 1 |
| 06 | පාලි වර්ණ මාලාව 11 | 2 |
| 07 | පාලි වර්ණ මාලාව III | 3 |
| 08 | පාලි නාම වරනැගීම | 4-5 |
| 09 | පාලි ආඛ්‍යාත වරනැගීම | 6-7 |
| 10 | සන්ධි භාවිතය 1 | 8 |
| 11 | සන්ධි භාවිතය 11 | 9 |
| 12 | සන්ධි භාවිතය 111 | 10 |
| 13 | පාලි සමාස 1 | 11-12 |
| 14 | පාලි සමාස 11 | 13 |
| 15 | පාලි තද්ධිත | 14 |
| 16 | පාලි ගද්‍ය පරිවර්තන 1 | 15-16 |
| 17 | පාලි ගද්‍ය පරිවර්තන 11 | 17 |
| 18 | පාලි ගද්‍ය පරිවර්තන 111 | 18 |
| 19 | පාලි පද්‍ය පරිවර්තන | 19-20 |
| 20 | පාලි භාෂාව ප්‍රායෝගික භාවිතය | 21 |
| 21 | තක්සේරුව හා ඇගයීම | 22 |
| 22 | ඒ ඒ වාර සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු අනුපිළිවෙළ (නිපුණතා මට්ටම් අනුව) | 23 |
| 23 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 24-26 |

# 10 ශ්‍රේණිය

# පාලි

## විෂය නිර්දේශය

## 01. විෂය හැඳින්වීම

පන්සාළිස් වසක් මුළුල්ලේ බුදුරජාණන් වහන්සේ විසින් දෙසූ ත්‍රිපිටක බුද්ධ වචනය මෙන් ම ඒ හා බැඳුණු අටුවා, ටීකා, ටිප්පනී, හා වංශකථා ආදී ග්‍රන්ථ සමුදායක් ලේඛනගත ව ඇත්තේ මාගධී භාෂාවෙන් හෙවත් පාලි භාෂාවෙනි. මහින්දාගමනයෙන් ලත් උරුමයක් වූ මෙකී භාෂාව මධුර ද, සුබනමා්‍ය ද වේ. එය ශබ්ද, අර්ථ රස ජනනයට මෙන් ම ලෝකෝත්තර තත්ත්වයන් ප්‍රකාශ කිරීමට ද, සමත් භාෂාවක් බව වියත් මතය යි. එය සුරක්ෂිත කොට පෝෂණය කිරීමේ වගකීම අද පැවරී ඇත්තේ ශ්‍රී ලාංකික බෞද්ධයාට ය. හෙළබස ඇතුළු භාෂා රැසක් පෝෂණය කළා වූ ද බෞද්ධ සංස්කෘතික උරුමය හා බුදුදහම ලෝකයේ ජීවමාන කරවන භාෂාව ද පාලි භාෂාව ම ය.

පාලිය, මවු බසේ අක්ෂරවලින් ම ලිවිය හැකි බැවින් ලෝකයේ සියළු දෙනාට ලිවීමට කියවීමට පහසුය. උපතේ සිට මරණය දක්වා ම අසන්නට ලැබෙන බෞද්ධ ආගමික කටයුතුවල දී නිරන්තරයෙන් භාවිත වන භාෂාවකි, පාලි භාෂාව. පන්සිල්, පිරිත්, වන්දනා ගාථා, ආශිර්වාද හා උපදේශ ආදිය සිංහල බෞද්ධයා දිනපතා භාවිත කරයි. පාලි භාෂාව සිංහල බෞද්ධයාට අමුතු භාෂාවක් නොවන්නේ එහෙයිනි.

කරුණා, මෛත්‍රී සහගත වචනවලින් පිරි ආර්ය භාෂාවක් වන පාලි භාෂාව හැදැරීමෙන් ලෞකික හා ලෝකෝත්තර සුවයක් මෙන් ම පුළුල් ධර්මඥානයක්, භාෂාඥානයක් හා සංස්කෘතික වටිනාකමක් ද ලැබිය හැකි ය. එසේ ම ඉතිහාසය සෞන්දර්ය වැනි විෂයන් ද පාලි භාෂාව හැදැරීමෙන් අපට ලැබෙන වටිනාකම් සේ සැලකිය හැකි ය.

පාලි භාෂාව හැදැරීමෙන් ඉහත දැක් වූ දැනුම් සම්භාරය ලබා දීම මෙන් ම ඉන් ලැබෙන සාරධර්ම චරිතායනය කිරීමෙන් ආත්ම දමනයෙන් හා මනා පෞරුෂයකින් හෙබි දරුපරපුරක් ද රටට දායාද කළ හැකි ය. 10, 11 ශ්‍රේණි සඳහා නිර්දේශිත පාලි විෂය නිර්දේශයේ ප්‍රමුඛ අරමුණ එය යි.

# 02 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## 03 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## 04 පාලි භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

- පාලි භාෂාව නිවැරදි ව උච්චාරණ කිරීමේ හා ලිවීමේ හැකියාව ඇති කිරීම.
- පාලි භාෂාවේ අක්ෂර වින්‍යාසය, විවිධ වාක්‍ය, පද රටා හුරු කිරීම.
- සිංහල බෞද්ධ සංස්කෘතික හා ආගමික අවස්ථාවන්හි භාවිත වන පාලි සූත්‍ර, ගාථා පාඨවල අර්ථාවබෝධය ලබා දීම.
- පාලි ගද්‍ය පද්‍ය පාඨ මාතෘ භාෂාවටත්, මාතෘ භාෂාවෙන් පාලි භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ඇති කිරීම
- පාලි සාහිත්‍යය පිළිබඳ  අවබෝධයක් ලබාදීම හා එහි එන ජීවන දර්ශනය උපයෝගී කරගනිමින් සාර්ථක තෘප්තිමත් ජීවිතයකට හුරු කිරීම
- ත්‍රිපිටකාගත හරධම් චරිතායනය කෙරෙන ආදර්ශවත්, චරිතවත් මනා පෞරුෂයක් සහිත ප්‍රජාවක් රටට දායාද කිරීම
- ආගමික චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ  අවබෝධයෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම ප්‍රකට කිරීම
- පාලි භාෂාව තමාගේත් ජාතියේත් රටේත් උරුමයක් බව තහවුරු කිරීම
- පාලි භාෂාව ඉගැනීමෙන් මෙලොව පරලොව සුභසිද්ධිය ළඟා කරගත හැකිබව තහවුරු කිරීම.

## 10 ශ්‍රේණිය පාලි විෂය

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 10 | i. | 1.1, 1.2, 1.3, 2.1, 2.2, 2.3, 2.4, 3.1 | 30 |
| | ii. | 3.2, 3.3, 4.1, 4.2, 4.3, 4.4, 5.1, 5.2, 5.3, 5.4, 5.5 | 30 |
| | iii. | 6.1, 6.2, 6.3, 7.1, 7.2, 7.3, 8.1, 8.2, 8.3 | 30 |
| | | එකතුව | 90 |

10 ශ්‍රේණිය

## 05 පාලි විෂය නිර්දේශය.

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කරයි. | 1.1 පාලි අක්ෂර මාලාව පිළිවෙළින් ලියා දක්වයි.<br>1.2 අක්ෂර මාලාව සියලු ප්‍රභේද සහිත ව වගු ගතකොට දක්වයි.<br>1.3 ලේඛනයේදී සංයුක්තාක්ෂර භාවිත කරයි. | • පාලි වර්ණ මාලාව<br>• අක්ෂර මාලාවේ සියලු ප්‍රභේද<br>• ස්වර (හ්‍රස්ව, දීඝ)<br>• ව්‍යඤ්ජන (අල්පප්‍රාණ මහාප්‍රාණ)<br>• වර්ගාක්ෂර (ඝෝෂ, අඝෝෂ,)<br>• සංයුක්තාක්ෂර | • අක්ෂර මාලාව නිවැරදි ව උච්චාරණය කරයි, ලියා දක්වයි.<br>• අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර නිවැරදි ව භාවිත කරයි.<br>• සංයුක්තාක්ෂර සහිත පද කියයි, ලියයි.<br>• අක්ෂර මාලාව ප්‍රභේද සහිත ව වගුගත කරයි. | 09 |
| 02 පාලි නාම වරනැගීම හා විභක්ති ව්‍යවහාරය අවබෝධයෙන් භාවිත කරයි | 2.1 විභක්ති හා වචන භේදය හඳුනා ගනියි.<br>2.2 ශබ්දාන්ත වශයෙන් නාම වරනැගීම වෙන්කර තේරුම් ගනියි.<br>2.3 විභක්ති අර්ථ තේරුම් ගෙන ලියා දක්වයි.<br>2.4 විවිධ ස්වරාන්තවත් ශබ්ද කිහිපයක් වරනගයි. | • විභක්ති හා වචන භේදය<br>• විභක්ති අර්ථ<br>• පුරුෂ ලිංග ශබ්ද (බුද්ධ, අග්ගි, දණ්ඩී, භික්ඛු )<br>• ස්ත්‍රී ලිංග ශබ්ද (මාලා, භූමි,තරුණී, ධෙනු )<br>• නපුංසක ලිංග ශබ්ද (නයන,අට්ඨි, දණ්ඩි, වායු ) | • නාමයක් විභක්තිවල වරනගා අර්ථ දක්වයි.<br>• විභක්ත්‍යර්ථ පැහැදිලි වන ලෙස පාලි වාක්‍ය සකසයි.<br>• ලිංගත්‍රයට අයත් නාම වරනගයි, වෙනස්කම් කියයි.<br>• තෝරාගත් විභක්ත්‍යන්ත පද ලිංග, විභක්ති, වචන වශයෙන් වර්ග කරයි. | 18 |
| 03 විවිධ ක්‍රියා ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි. | 3.1 පාලි ආඛ්‍යාත වරනැගීමේ වගුව හඳුනාගෙන ලියා දක්වයි.<br>3.2 අතීත, වර්තමාන, අනාගත ආඛ්‍යාත වරනගා අර්ථ කියයි.<br>3.3 ආඛ්‍යාත පද යොදා වාක්‍ය සාදයි. | • ආඛ්‍යාත වරනැගීමේ වගුව<br>• වත්තමාන ආඛ්‍යාතය<br>• අජ්ජතනී ආඛ්‍යාතය<br>• භවිස්සන්ති ආඛ්‍යාතය | • වර්තමාන, අනාගත, අතීත ආඛ්‍යාත ප්‍රත්‍යමාලා මතකයෙන් කියයි, ලියයි.<br>• වාක්‍යයක ඇති ආඛ්‍යාත පද උපුටා දක්වා කාලය නම් කොට අර්ථ කියයි.<br>• ධාතුවක් කාලත්‍රයේ වරනගා දක්වයි.<br>• ආඛ්‍යාත පද භාවිත කරමින් සරල වාක්‍ය සාදා සිංහලයට නගයි | 11 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04 පාලි භාෂාවේ සන්ධි භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | 4.1 සන්ධි හඳුන්වා සන්ධි කාර්යය පැහැදිලි කරයි.<br>4.2 සන්ධි ප්‍රභේද නම් කොට උදාහරණ දක්වයි.<br>4.3 සන්ධි විධි යොදා ගනිමින් ස්වර සන්ධිය විස්තර කරයි. | • සන්ධි හැඳින්වීම<br>• සන්ධි ප්‍රභේද<br>• ලෝප, ආදේශ, ආගම, හ්‍රස්ව, දීර්ඝ, ද්විත්ව, ආරෝහණ හා විපර්යාස<br>• ස්වර, ව්‍යඤ්ජන, නිග්ගහීත සන්ධි වර්ග | • සන්ධි හඳුන්වා, ප්‍රයෝජන ලියා සන්ධි කාර්යය නම් කරයි.<br>• විසන්ධි පද සන්ධි කොට දක්වයි<br>• සන්ධි පද උපුටා විසන්ධි කොට සන්ධි ප්‍රභේදය නම් කරයි.<br>• සන්ධි පද භාවිත කරමින් සරල වාක්‍ය නිර්මාණය කරයි. | 07 |
| 05 පාලි භාෂාවේ සමාස හා තද්ධිත හඳුනාගෙන භාවිත කරයි. | 5.1 සමාස කෙටියෙන් හඳුන්වයි.<br>5.2 සමාසයේ ප්‍රයෝජන ලියා දක්වයි.<br>5.3 ඒ ඒ සමාස ප්‍රභේදය සඳහා උදාහරණය බැගින් දක්වයි.<br>5.4 තද්ධිත කෙටියෙන් හඳුන්වයි.<br>5.5 තද්ධිත ප්‍රභේද නම් කොට උදාහරණය බැගින් දක්වයි. | • කම්මධාර, තප්පුරිස, බහුබ්බීහි, දිගු, ද්වන්ද, අබ්‍යයීභාව යන සමාස පිළිබඳ සරල අවබෝධය<br>• අපච්චත්ථ, සංඛ්‍යා, භාව, අනේකත්ථ, අත්ථ්‍යත්ථ යන තද්ධිත පිළිබඳ සරල අවබෝධය | • සමාස පද හඳුනාගෙන ප්‍රයෝජන ලියයි.<br>• සමාස ප්‍රභේද නම් කොට උදාහරණ දක්වයි.<br>• තද්ධිත පද හඳුනාගෙන ප්‍රභේද නම් කොට උදාහරණ දක්වයි.<br>• ඡේදයක ඇති සමාස හා තද්ධිත පද උපුටා දක්වයි. | 15 |
| 06 නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි. | 6.1 සරල පාලි පාඨ සිංහලයට නගයි.<br>6.2 සරල සිංහල පාඨ පාලියට නගයි.<br>6.3 ව්‍යාකරණානුකූල ව සරල පාලි ඡේද සිංහලයට නගයි. | • පාලි භාෂාවතරණය I පොත (1 සිට10 දක්වා පාඩම්)<br>• පාලි රචනා 1 පොත (කුක්කුටො 22 පාඩම) | • භාෂා රීති අනුගමනය කරමින් පරිවර්තන කාර්යයේ යෙදෙයි.<br>• සරල පාලි පාඨ සිංහලයට නගයි.<br>• සරල සිංහල වාක්‍ය පාලියට නගයි.<br>• ඒකවචන වාක්‍ය බහු වචනයටත්, බහු වචන වාක්‍ය ඒක වචනයටත් හරවා ලියයි. | 10 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 07.නිර්දිෂ්ට ගද්‍ය, පද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් කියවයි. | 7.1 නිර්දිෂ්ට ගද්‍ය, පද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි.<br>7.2 නිර්දිෂ්ට පද්‍ය පාඨ රිද්මයානුකූල ව ගායනා කරයි.<br>7.3 ගද්‍ය පද්‍ය පාඨයන්හි සරලාර්ථය ප්‍රකාශ කරයි. | • ජාතකට්ඨකථා - මහා සුපින ජාතකය - (පළමු ඡෙද 03)<br>• ධම්මපදය (අප්පමාද වග්ගය) | • නිවැරදි පද බෙදීම් සහිතව පාලි ගද්‍ය පද්‍ය පාඨ උච්චාරණය කරයි.<br>• ගාථා පාඨ රිද්මයානුකූලව ගායනා කරයි.<br>• ගද්‍ය පද්‍ය පාඨවල සරල අර්ථය කියයි, ලියයි.<br>• නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ අසා කියවා රසවිඳියි, සතුට පලකරයි. | 10 |
| 08 පාලි භාෂාව ප්‍රායෝගික ව භාවිත කිරීමේ හැකියාව ලබයි. | 8.1 ජීවිතයේ විවිධ අවස්ථාවල ප්‍රායෝගික ලෙස පාලි භාෂාව භාවිත වන බව ප්‍රකාශ කරයි.<br>8.2 දිනපතා අදහස් හුවමාරු කරගැනීමට පාලි භාෂාව යොදා ගනියි.<br>8.3 පාලි භාෂාවෙන් ඇති ආදර්ශ පාඨ අවස්ථාවෝචිතව භාවිත කරයි. | • පාලි රචනා 2 පොත (කථාසල්ලාපො, බුදෙධා-පාඩම් දෙක)<br>• බෝධි පූජා පිරිත් වැනි ආගමික කටයුතු හා මාපිය වන්දනා ආදීයේ දී පාලි භාෂාව භාවිත කිරීම.<br>• ආයතනවල ආදර්ශ පාඨ හා වෙනත් හැඳින්වීම් ලෙස ඇති පාලි පාඨ එක්රැස් කිරීම. | • සංවාදයේ යෙදෙයි<br>• සුභපතයි<br>• ආදර්ශ පාඨ එකතු කරයි.<br>• ගාථා පාඨ ආදිය කියයි, අර්ථ දක්වයි. | 10 |

xvii

# නිර්දිෂ්ට ග්‍රන්ථ

**(අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට නියමිත)**

- 10 ශ්‍රේණිය (පාලි භාෂාව 10 - 11 පොත) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, පළමුවන මුද්‍රණය 1993

**අතිරේක කියවීම් සඳහා,**

- පාලි භාෂාවතරණය i - පොල්වත්තේ බුද්ධදත්ත හිමි
- පාලි භාෂාවතරණය ii - පොල්වත්තේ බුද්ධදත්ත හිමි
- පාලි රචනා i- ii - බද්දේගම විමලවංස හිමි
- පාලි පාඨමඤ්ජරී i-ii - කහඳමෝදර පියරතන හිමි
- New Pali course i – Buddhist cultural center

## 06 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය

පාලි භාෂාව ඉගැන්වීම පන්ති කාමරයට සීමා කළයුතු නොවේ. බෞද්ධ ආගමික කටයුතුවලදී පාලි භාෂාව නිරන්තරයෙන් ම භාවිත කෙරේ. එබඳු කටයුතු වෙත සිසුන් නැඹුරු කිරීම තුළින් පාලි භාෂාව ඉගැනීම කෙරෙහි සිසුන්ගේ අභිරුචිය වැඩිකර ගත හැකි වෙයි. ඒ සඳහා වු පන්ති කාමරයෙන් බැහැරව පාලි භාෂාව අධ්‍යයනයට සිසුන් තුළ ආශාවක්, උනන්දුවක් ඇති කළ හැකි අවස්ථා කිහිපයක් මෙහි යෝජනා කරමු.

1. පාලි සමිතියක් පවත්වා ගෙනයෑම
2. ශිෂ්‍ය සමිතියේ පාලි කතාවක්/ ගාථා ගායනයක් ඉදිරිපත් කිරීම
3. පාලි බිත්ති පුවත්පතක් පවත්වා ගෙන යෑම
4. පාලි ආදර්ශ පාඨ එකතු කොට ශිෂ්‍ය සමිති වාර්තා පොතට ඇතුළත් කිරීම (නමෝ බුද්ධාය, ජයං වෙරං පසවති, යෙ පමත්තා යථා මතා)
5. පාලි ගාථා ගායනා/ පාලි කවීක තරග ඉදිරිපත් කිරීම
6. පාසල් ආරම්භක රැස්වීමේදී පාලි කථාවක් පැවැත්වීම
7. පාසල් භාෂා දිනයක් පවත්වා පාලියෙන් අදහස් හුවමාරුවට සිසුන් යොමු කිරීම
8. විශේෂ දක්‍ෂතා හා හැකියාවන් ප්‍රදර්ශනය කරන සිසු දරුවන්ට ත්‍යාග හා සහතික ප්‍රදානයක් කිරීම

# 07 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මකව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම් කාර්යයේදී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලයන්ගේ ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟ වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදුවේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමඟ සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ළමයා සාක්ෂාත් කරගෙන තිබේදැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා, දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ පෝෂණ වැඩ සටහන් සංවිධානය කළ යුතුය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේශණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

10 ශ්‍රේණිය සඳහා නව පාලි විෂය නිර්දේශය සකස් වී ඇත්තේ නිපුණතා පදනම් කරගෙන ය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී සාම්ප්‍රදායික ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ. සාම්ප්‍රදායික ව භාවිත කළ දේශන ක්‍රමය පදනම් කරගත් සම්ප්‍රේෂණ ගුරු භූමිකාව වෙනුවට නව ක්‍රියාකාරී සිසු විභවතා මතුකර ගැනීමට සමත් ගුරු භූමිකාවක අවශ්‍යතාව පැන නැගී ඇත. නිපුණතා පාදක විෂය නිර්දේශයේ මුඛ්‍ය අපේක්ෂණය වන්නේ දරුදැරියන්ගේ චින්තන කුසලතාව, පුද්ගල කුසලතාව, සමාජ කුසලතාව හා ආචාරාත්මක සංවර්ධනය ගොඩ නැගීමයි.

බුදුරජාණන් වහන්සේ තුන්ලොවට ම ගුරුවූ සේක. උන්වහන්සේ තම දර්ශනය (දහම) ප්‍රචලිත කිරීමට භාවිත කළ ක්‍රමවේද සමුදායකි. පුද්ගල වෛමත්තතාව (විවිධත්වය) තේරුම් ගෙන ඊට ගැලපෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන් යොදා ගැනීමට උන්වහන්සේ වගබලා ගත්හ. එසේ භාවිත කළ ක්‍රමවේද අතර පහත සඳහන් ක්‍රම දක්නට ලැබෙයි.

1. පැවරුම් ක්‍රමය - චුල්ලපන්ථක හිමි, කිසාගෝතමී
2. දේශන ක්‍රමය - පස්වග මහණුන්ට කළ ධම්මචක්ක හා අනත්තලක්ඛණ සූත්‍ර දේශනා
3. ප්‍රශ්න විසඳුම් ක්‍රමය - පරාභව සූත්‍රය
4. ක්ෂේත්‍ර අධීක්ෂණය - නන්ද හිමි දෙව්ලොව කැඳවාගෙන යාම

උන්වහන්සේ ඉතා සරල ක්‍රම මඟින් තම දර්ශනය හා චරණය ශ්‍රාවකයා වෙත ගෙන යාමේදී පවත්නා මානව හා භෞතික සම්පත් කළමණාකරණය පිළිබඳ සැළකිලිමත් වූ සේක. ප්‍රථම ධර්මදූත 60 නම අමතා 'චරථ භික්ඛවෙ චාරිකං,....'යනාදී අවවාදය මෙහිදී ඉතා වැදගත් කොට සැළකිය හැකිය. උගන්වනු ලබන දෙය කෙතරම් සංකීර්ණ වුවත් ශිෂ්‍යයා කවර මට්ටමක සිටියත් උපක්‍රමශීලී ගුරුවරයා ශිෂ්‍යයාගේ මනස කියවා ඔහුගේ කායික මානසික චිත්තාවේග හා සාමාජීය ස්වභාවය අවබෝධ කොට ගත යුතුය. අනතුරුව ඔහුට ගැලපෙන පරිදි පාඩම සකස් කිරීම කළ යුතු අතර සුදුසු ක්‍රමවේදයකින් එය සිසුවාට ප්‍රවේශ කිරීමට වගබලා ගත යුතුය. බුද්ධදේශනාවන්හි පහත දැක්වෙන ආකාරයේ විචිත්‍රවත් ඉගැන්වීම් ක්‍රම දැකිය හැක.

1. ආචික්ඛනා, දේසනා, පඤ්ඤපනා, පට්ඨපනා, විවරණා, විභජනා උත්තානිකම්ම (සච්චවිභංග සූත්‍රය)
2. දානකථා, සීලකථා, සග්ගකථා..... (ආනුපුබ්බී සූත්‍රය)
3. ආදිකල්‍යාණං, මජ්ඣෙ කල්‍යාණං, පරියෝසාන කල්‍යාණං (මුල, මැද , අග හොඳින් විවරණය කිරීම)
4. අස්සුතං සුනාති සුතං පරියොදපෙති, කඞ්ඛං විතරති, දිට්ඨිං උජුං කරොති, චිත්තමස්ස පසීදති.
5. පරිඤ්ඤෙය්‍යං, පහාතබ්බං, භාවෙතබ්බං, සච්ඡිකාතබ්බං
6. ඡන්ද, චිත්ත, විරිය, වීමංසා යනාදී වශයෙනි

මෙසේ බුදුන් වහන්සේ යොදාගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද රාශියක් ත්‍රිපිටකය පුරා විසිරී පවතී. මෙහිදී විශේෂයෙන් අවධාරණය කළ යුත්තේ පාලි භාෂාව පමණක් නොව අන් කවර විෂයක් වුව ද ඉගැන්වීමට ඉදිරිපත් වන ගුරුවරයා මෙම බෞද්ධ ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ලබාගැනීම ඉතා වැදගත් බවයි.

සුදුසු අවස්ථාවේදී ශිෂ්‍යයාගේ දක්ෂතා ඇගයීම ද නිරතුරුව ම ශිෂ්‍යයා අධීක්ෂණය කිරීම ද සිදුවිය යුතු ම ය. එහිදී සතර අගතියෙන් වෙන්ව පිය සෙනෙහස උපදවා මෛත්‍රී සහගත සිතින් කටයුතු කිරීමත්, ශිෂ්‍යයාගේ විශ්වාසය දිනාගැනීමත් ඉතා ප්‍රයෝජනවත් වෙයි. විෂය පිළිබඳ දැනුම, ඉවසීම, අටලෝදහමින් කම්පා නොවීම වැනි ගුණාංග පුරුදු පුහුණු කොට තිබීම අතිරේක සුදුසුකමකි.

මුළු මහත් බෞද්ධ දර්ශනය ම නිපුණතා පාදක වූවකී. නූතන අධ්‍යාපන ක්‍රමය ද එසේ සැකසී ඇත. පාලි භාෂා අධ්‍යයනය ද නිපුණතා පාදක වූවකි. එබැවින් සාම්ප්‍රදායික පන්තිකාමර, ගුරුකේන්ද්‍රීය අධ්‍යාපනයෙන් මිදී සිසුවා වෙත සමීප වීමටත්, නවීන තාක්ෂණය ද ප්‍රයෝජනයට ගනිමින් ගුරුවරයාට බහුවිධ භූමිකාවක් රඟපෑමටත් සිදුවෙයි. ඒ අනුව ගුරුවරයා විටෙක,

1. කායික හා මානසික වෛද්‍යවරයෙක්,
2 සමාජ සේවකයෙක්,
3 ආදරණීය මවක්, පියෙක්,
4 දක්ෂ නළුවෙක්,
5 කල්‍යාණ මිත්‍රයෙක්,
6 මාර්ගෝපදේශකයෙක්,
7 පහසුකම් සපයන්නෙක්

වැනි භූමිකා රාශියකට අනුගත වීමට සිදුවෙයි. එබඳු ගුරුවරයාට සිසුවා තුළ පුද්ගල මෙන් ම සමාජ කුශලතා හා ආචාරාත්මක සංවර්ධනයක් ඇති කිරීම කිසි විටෙක දුෂ්කර නොවෙයි. එබඳු සිසුවෙකුගේ මුවින්ද එදා කසීභාරද්වාජ බමුණාගේ මුවින් පිටවූ වදන් සේ, ''විශිෂ්ටයි ගුරුතුමනි, විශිෂ්ටයි. කෙසේද යත්, ඔබේ ඉගැන්වීම මට යටිකුරුවුවක් උඩුකුරු කළාසේ ද, වසා තැබූවක් විවර කළා සේ ද, මංමුලා වූවෙකුට මඟ කීවාසේ ද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරේ සිටියදී පහනක් දැල්වූවාසේ ද ප්‍රකට විය.'' වැනි ස්තුති වදන් ප්‍රකාශ කරනු ඒකාන්තය.

අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රයේ දී නිදසුනක් උපයෝගි කරගෙන කරුණක් පැහැදිලි කරන අයුරු පහත උද්ධෘතයෙන් ප්‍රකට වේ. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ස්වල්ප වූ ජල ප්‍රමාණයක් දිය බඳුනෙහි ඉතිරි කොට තබා ආයුෂ්මත් රාහුල ඇමතූ සේක. රාහුල, දිය බඳුනෙහි ඉතිරි කොට තබා ඇති මේ ස්වල්ප වූ ජල ප්‍රමාණය තොපට පෙනේ ද? එසේය ස්වාමීනි, රාහුල යම් කෙනෙකුට බොරු කීමෙහි ලජ්ජාවක් නැද්ද ඔවුන්ගේ මහණ ජීවිතයේ අර්ථය ද මේ වාගේ ස්වල්ප වූවකි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ ස්වල්ප වූ ඉතිරි ජලය විසිකොට ආයුෂ්මත් රාහුල ඇමතූහ. රාහුල ස්වල්ප වූ ඉතිරි ජලය විසි කරන ලදැයි දක්නෙහිද? එසේය ස්වාමීනි, රාහුල, යමෙකුට බොරු කීමෙහි ලැජ්ජාවක් නැද්ද රාහුල, ඔවුන්ගේ මහණකම ද එසේම ඉවත දමන ලද්දේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම දිය බඳුන යටිකුරුකොට අයුෂ්මත් රාහුල ඇමතූහ. රාහුලය, මේ යටිකුරු කළ ජල බඳුන දක්නෙහිද? ස්වාමීනි එසේය. එසේම යම් කෙනෙකුට දැන දැන බොරු කීමෙහි ලැජ්ජාවක් නැද්ද? ඔහුගේ මහණකම ද යටිකරු කරන ලද්දේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එම ජල බඳුන උඩුකුරු කොට ආයුෂ්මත් රාහුල ඇමතූහ. රාහුලය, මේ ජල බඳුන හිස් – ශුන්‍ය වූයේ දක්නෙහි ද? ස්වාමීනි එසේය, රාහුලය එසේම යමෙකුට බොරු කීමෙහි ලැජ්ජාවක් නැද්ද ඔහුගේ මහණකම හිස් – ශූන්‍ය වූවකි "
(අම්බලට්ඨිකා රහුලෝවාද සූත්‍රය – මජ්ඣිම නිකාය)

බුදු රජාණන් වහන්සේ ඉහත දැක් වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය කොතරම් සරල සුගම වූවක් ද යන්න පැහැදිලි ය. පාලි භාෂාව උගන්වන ගුරුවරයා ද ශිෂ්‍යයාගේ නිපුණතා සංවර්ධනයට අවශ්‍ය ඉගැන්වීම් උපකරණ සම්පාදනය කොට ගෙන ඒ ඒ සිසුවාගේ බුද්ධියට ගෝචර වන ක්‍රම අනුගමනය කරමින් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය කළ යුතු ය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රබල ස්ථානයක් ගනී. එනිසා සෑම ශිෂ්‍යයෙකුට ම නිපුණතාව සම්බන්ධයෙන් අවම වශයෙන් ආසන්න ප්‍රවීණතාවකට ගෙන ඒමට ගුරුවරයා සමත් විය යුතුය.

විෂය නිර්දේශයේ එන 1 සිට 6 දක්වා නිපුණතා මගින් අපේක්ෂා කරන්නේ පාලිභාෂාව හා සම්බන්ධ භාෂා සාහිත්‍යමය නිපුණතාවට සිසුවා පත් කිරීමයි. මෙම නිපුණතා ප්‍රගුණ කිරීමේ දී නිර්දිෂ්ට ග්‍රන්ථයේ එන පාඩම් ඇසුරින් නිදර්ශන හැකිතාක් සෙවීමට මෙහෙයවීම් කළයුතු අතර සිසුන්ගේ ඉදිරිපත් කිරීම්වල ඇති දුර්වලතා මග හැරවීම සඳහා ප්‍රතිපෝෂණ කාර්යය ද කළ යුතු ය. සංකල්ප හා න්‍යාය පිළිබඳ නිවැරදි අවබෝධය තහවුරු වන ලෙස පාඩම් සමාලෝචනය කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ. පංති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව ඉටුන්නේ දැයි නිවැරදිව සොයා බැලීම ගුරුවරයාගේ ප්‍රධාන වගකීමකි. මේ සඳහා ගුරුවරයා විසින් තක්සේරුව හා ඇගයීම් ක්‍රියාවලිය යොදා ගත යුතු ය. මෙම ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් ගුරුවරයා හා ශිෂ්‍යයා අතර අන්‍යෝන්‍ය සබැඳියාව මෙන් ම ශිෂ්‍යයන්ගේ අපේක්ෂිත නිපුණතාව ද සාධනය කර ගත හැකි වනු ඇත.

# පාලි වර්ණමාලාව I

**01නිපුණතාව**

පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 පාලි වර්ණමාලාව පිළිවෙළින් ලියා දක්වයි.

**කාලච්ඡේද 03**

**ඉගෙනුම් පල**

- පාලි අක්ෂර මාලාව පිළිවෙළින් කියයි.
- ව්‍යඤ්ජනාක්ෂර ස්වරාරූඪ කොට ලියා දක්වයි.
- පාලි ස්වර ප්‍රභේද නම් කොට ලියා දක්වයි.
- පාලි භාෂාවේ එ,ඔ, භාවිතය පැහැදිලි කරයි.
- ව්‍යඤ්ජනාක්ෂර ප්‍රභේද සහිතව ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- පාලි අක්ෂර මාලාවේ අක්ෂර සංඛ්‍යාව හතළිස් එකක් බව.
- ස්වර අටක් බව.
- වර්ගාක්ෂර සංඛ්‍යාව විසි පහක් බව.
- අවර්ගාක්ෂර සංඛ්‍යාව අටක් බව.
- මුළු ව්‍යඤ්ජනාක්ෂර සංඛ්‍යාව තිස්තුනක් බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- උචිත ප්‍රවේශයකින් ආරම්භ කරන්න.
- පාලි හෝඩියේ අක්ෂර නිවැරදි ව උච්චාරණය කොට සමරූපණය කරවන්න.
- අක්ෂර උච්චාරණයේ දී හා ලේඛනයේ දී රූපාකාර හා ශබ්දාකාර බව පැහැදිලි කරන්න.
- අක්ෂර ලිවීමේ දී අක්ෂරවල අනන්‍යතාව පෙන්වා දෙන්න.
- ව්‍යඤ්ජනාක්ෂර ස්වරාරූඪ කොට දක්වන්න.

**තක්සේරුව හා ඇගයීම**

- පාලි අක්ෂර මාලාව පිළිවෙළට ලියයි.
- පාලි ව්‍යඤ්ජනාක්ෂර ස්වරාරූඪ කොට ලියයි.
- සියලු අක්ෂර ප්‍රභේද වෙන වෙන ම ලියයි.
- පාලි හෝඩිය නිවැරදි ව මතකයෙන් කියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි, සිංහල අක්ෂර මාලා සහිත පුවරු
- අකුරු මලු
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- බාලාවතාරය
- පාලි භාෂාවතරණය 1 පොත

## පාලි වර්ණමාලාව II

**01.නිපුණතාව**

පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කරයි.

**නිපුණතා මට්ටම**

1.2 පාලි අක්ෂර මාලාව සියලු ප්‍රභේද සහිත ව වගුගත කොට දක්වයි.

**කාලච්ඡේද 03**

**ඉගෙනුම් පල**

- අක්ෂර මාලාවේ ප්‍රභේද ඇතුළත් කොට වගුවක් සකස් කරයි.
- ස්වරාරම්භක වචන 10 ක් උපුටා දක්වයි.
- මහාප්‍රාණ අක්ෂර සහිත වචන 10 ක් ලියයි.
- පාලි අක්ෂර මාලාවේ වගුගත කළ කොටස් මතකයෙන් කියයි, ලියා දක්වයි.
- අවර්ගාක්ෂර යෙදී ඇති වචන සොයා ලියයි.
- බින්දුව (නිග්ගහීතය) යෙදී ඇති පාලි වචන ලියයි.
- අක්ෂර මාලාවේ ඝෝෂ, අඝෝෂ, මහප්‍රාණ, අල්පප්‍රාණ නොබිඳ උච්චාරණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- අක්ෂරමාලාව ප්‍රභේද සහිතව වගුවකින් දැක්විය හැකි බව.
- ස්වරවලින් මෙන් ම ව්‍යඤ්ජනවලින් ද වචන ආරම්භ වන බව.
- ඝෝෂ, අඝෝෂ, අල්පප්‍රාණ, මහප්‍රාණ, ප්‍රභේද ප්‍රකට කළ යුතු බව.
- ඞ,ඤ,ණ,න,ම යන අකුරු වර්ගාන්ත නම් වන බව.
- නිග්ගහීතය ව්‍යඤ්ජනාක්ෂරයක් ලෙස භාවිත වන බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- උචිත ප්‍රවේශයක් ලබා ගන්න.
- වගු ගතකිරීම් මගින් මතකයේ තබා ගැනීමට සලස්වන්න.
- පාලි ජේදවල යෙදී ඇති ස්වරාරම්භ වචන උපුටා දක්වන්න.
- ස්වර ව්‍යඤ්ජන දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.
- ඝෝෂ, අඝෝෂ, මහප්‍රාණ, අල්පප්‍රාණ සහිත පද නිවැරදි ව උච්චාරණය කරවන්න.
- බින්දුව (නිග්ගහීතය) සහිත පාලි වචන වාක්‍යවල යොදන්න.

**තක්සේරුව හා ඇගයීම**

- පාලි අක්ෂර මාලාව නිවැරදිව ලියයි.
- අවර්ගාක්ෂර ඇතුළත් වචන ලියා දක්වයි
- පාලි වර්ණ මාලාවේ ප්‍රභේද වගුවකින් දක්වයි.
- බිංදුව (නිග්ගහීතය) සහිත වචන ඇතුළත් කොට වාක්‍ය ලියයි.
- ස්වරාරම්භක වචන ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි භාෂාවතරණය I පොත
- පාලි පාඨමඤ්ජරිය
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය I පොත
- බාලාවතාරය

## පාලි වර්ණමාලාව III

**01.නිපුණතාව**

පාලි අක්ෂර මාලාව ප්‍රභේද ගත කරයි.

**නිපුණතා මට්ටම**

1.3 ලේඛනයේදී සංයුක්තාක්ෂර භාවිත කරයි.

**කාලච්ඡේද 03**

**ඉගෙනුම් පල**

- සංයුක්ත අක්ෂර යනු මොනවාදැයි පැහැදිලි කරයි.
- පාලි ලේඛන සම්ප්‍රදායානුකූල ව හල් අකුරු සංයුක්ත කොට ලියයි.
- සංයුක්තාක්ෂර භාවිත කරමින් වචන ලියයි.
- සංයුක්තාක්ෂර සහිත වචන කියවයි.
- අක්ෂර සංයුක්ත කිරීමේ දී (බැඳ ලිවීමේ දී) විවිධ ක්‍රමවලට සිදුවන බව පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- සංයුක්තය හල් අකුරු දෙකක් අතර සිදුවන බව.
- අක්ෂර සංයුක්තය වඩාත් වැදගත් වන්නේ පාලි භාෂාවේ ලේඛනයට බව.
- මහාප්‍රාණ අකුරු දෙකක් සංයුක්තව නොයෙදන බව.
- සංයුක්තාක්ෂර සහිත වචන පාලි භාෂාවේ සුලභ බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- හල් අකුරු කියවෙන තැන් ලේඛනයේ දි බැඳි අකුරු කොට ලියා දක්වන්න.
- ඇතැම් බැඳි අකුරු ලිවීමේ දී අකුරු වෙනස් නොකොට සම්පූර්ණ අකුරු දෙක බද්ධ කරන්න.
- ඇතැම් බැඳි අකුරු ලිවීමේ දී මුල් අකුරේ අඩක් ලියා බද්ධ කරන්න.
- හල් අකුරු දෙකකින් පර රකාරය වෙනුවට රකාරාංශය යොදන්න.
- හල් අකුරින් පර 'ය'කාරය වෙනුවට යංශය යොදන්න.
- සංයුක්තාක්ෂර සහිත වචනවල සංයුක්තය හල් කොට ලියන්න.
- සංයුක්තාක්ෂර ලිවීමේ දී ඒකාර ඕකාර භාවිතය පැහැදිලි කරන්න.
- මහප්‍රාණ අකුරු දෙකක් සංයුක්ත නොවන බව පෙන්වා දෙන්න.
- වර්ගාන්තාක්ෂර බැඳ ලිවීමේ දී ස්වවර්ගයේ අකුරු බැඳ ලියන්න.
- සංයුක්තාක්ෂර සහිත වචන, පාඨ එකතු කරන්න.

**තක්සේරුව හා ඇගයීම**

- පාලි පදවල හල් අකුරු කියැවෙන තැන් සංයුක්ත කර ලියයි.
- විවිධ ක්‍රමවලට අකුරු සංයුක්ත කර ලියයි.
- අකුරු සංයුක්ත වන හා සංයුක්ත නොවන තැන් පැහැදිලි කරයි.
- ස්ව වර්ගයේ අකුරු සමඟ සංයුක්ත වන වර්ගාන්ත අකුරුවලට නිදසුන් දක්වයි.
- අක්ෂර සංයුක්ත කළ වචන යොදා පාලි ඡේදයක් ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි භාෂාවතරණය 1 පොත
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- බාලාවතාරය
- පාලි භාෂාව 1 මූලික පිරිවෙන

## පාලි නාම වරනැගීම

**02 නිපුණතාව**

පාලි නාම වරනැගීම හා විභක්ති ව්‍යවහාරය අවබෝධයෙන් භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

2:1 විභක්ති හා වචන භේදය හඳුනා ගනී.

2.2 ශබ්දාන්ත වශයෙන් නාම වරනැගීම වෙන්කර තේරුම් ගනියි.

2.3 විභක්ති අර්ථ තේරුම් ගෙන ලියා දක්වයි.

2.4 විවිධ ස්වරාන්තවත් ශබ්ද කිහිපයක් වරනගයි.

**කාලච්ඡේද 18**

**ඉගෙනුම් පල**

- නාමයක් ලිංග හා ශබ්දාන්ත වශයෙන් වෙනස්වන බව ප්‍රකාශ කරයි.
- ලිංග හා ශබ්දාන්ත අනුව නාම වරනැගීම වෙනස් වන බව පැහැදිලි කරයි.
- නාමයක් විභක්ති නවයේ වචන දෙකේ වරනගා දක්වයි.
- ඒ ඒ විභක්තිවල මූලික අර්ථය දැනගෙන භාවිත කරයි.
- අකාරාන්ත පුල්ලිංග නාමයක් සියලු විභක්තීන්හි වරනගා අර්ථ ගන්වයි.
- අකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත පුල්ලිංග නාම උපුටා දක්වයි.
- ආකාරාන්ත, ඉකාරාන්ත ඊකාරාන්ත ස්ත්‍රීලිංග නාම හඳුනා ගෙන වරනගයි.
- ස්ත්‍රී ලිංග ශබ්දයක් සියලු විභක්තිවල වරනගා අර්ථ ගන්වයි.
- අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත නපුංසක ලිංග ශබ්ද හඳුනා ගෙන වරනගයි.
- වරනගන ලද ශබ්දවලට සමාන ශබ්ද වරනගා අර්ථ ගන්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- නාමයක්, ලිංග හා ශබ්දාන්ත වශයෙන් වෙනස්වන බව.
- නාමයක්, විභක්ති නවයේ ඒක වචන, බහු වචන වශයෙන් වරනැගෙන බව.
- ඒ ඒ විභක්තියට මූලික වූ අර්ථයක් ඇති බව.
- අකාරාන්ත නාමයක් සියලු විභක්තීන්හි වරනගා අර්ථ ගැන්වීමෙන් සෙසු ශබ්දවලට අර්ථ ගැන්වීම පහසු වන බව.
- බුද්ධ, අග්ගි, දණ්ඩී, භික්ඛු යන ශබ්ද පුල්ලිංග අකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ශබ්ද සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි බව.
- කඤ්ඤා, භූමි, තරුණී, ධෙනු යන ශබ්ද ස්ත්‍රී ලිංග ආකාරාන්ත ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත ශබ්ද සඳහා නිදසුන් ලෙස දැක්විය හැකි බව.
- ඵල, අට්ඨි, දණ්ඩී, ආයු යන ශබ්ද නපුංසක ලිංග අකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත ශබ්ද සඳහා උදාහරණ වන බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- නාමය හා නාම පදය අතර වෙනස දක්වන්න.
- නාම කිහිපයක් ලියා එම නාමයන්ගේ ලිංගය හා ශබ්දාන්තය පෙන්වා දෙන්න.
- අකාරාන්ත පුල්ලිංග ශබ්දයක් වරනගා අර්ථ ගන්වන්න.
- ලිංගත්‍රයට අයත් අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත ශබ්දය බැගින් වාචෝද්ගත කරවා අර්ථ ගන්වන්න.
- ඒ ඒ ශබ්දයට සමාන ව වරනැගෙන ශබ්ද ලබා දී වර නැගීමට සලස්වන්න.
- ශබ්ද වගුගත කොට සම විෂමතා පෙන්වා දෙන්න.
- නාමපද කිහිපයකට අර්ථ ගන්වා එවැනි නාමපද වලට, සිසුන්ගෙන් අර්ථ ලබා දෙන්න.
- ලිංගය හා ශබ්දාන්තය සමාන වුවද වරනැගීම වෙනස්වන ශබ්ද ඇති බව පෙන්වා ගන්න.

**තක්සේරුව හා ඇගයීම**

- නාම ලිංග වශයෙන් හා ශබ්දාන්ත වශයෙන් වෙන්කර දක්වයි.
- විභක්ති නවය මතකයෙන් ලියයි, කියයි.
- ඒ ඒ විභක්ති අර්ථය ප්‍රකාශ කරයි.
- ලිංගත්‍රයට අයත් අකාරාන්ත, ආකාරන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත ශබ්ද වරනගා අර්ථ ගන්වයි.
- ඒ ඒ ශබ්දවලට සමාන ශබ්ද වරනගා අර්ථ ගන්වයි.
- වාක්‍යවල යෙදෙන ආකාරය අනුව පදවලට අර්ථ යොදයි.
- රූප කීපයක් ඇති විභක්ති හඳුනා ගනියි. අර්ථ ප්‍රකාශ කරයි.
- ශබ්ද වගුගත කොට දක්වයි.
- ශබ්ද මතකයෙන් කියා අර්ථ ගන්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- වගු.
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- පාලි නාමාඛ්‍යාත වරනැගිල්ල.

**3. නිපුණතාව**

විවිධ ක්‍රියා ප්‍රභේද උචිත පරිදි භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

3.1 පාලි ආඛ්‍යාත වරනැගීමේ වගුව හඳුනාගෙන ලියා දක්වයි.

3.2 වර්තමාන, අනාගත, අතීත ආඛ්‍යාත වරනගා අර්ථ කියයි.

3.3 ආඛ්‍යාත පද යොදා වාක්‍ය සාදයි.

**කාලච්ඡේද 11**

**ඉගෙනුම් පල**

- ආඛ්‍යාත පදයක් වරනැගෙන වගුව සකස් කරයි.
- ආඛ්‍යාත පදයක් (ධාතුවක්) වර්තමාන කාලයේ වරනගයි.
- වර්තමාන කාල ප්‍රත්‍යමාලාව වෙන්කර ලියයි.
- පුරුෂත්‍රයට වචනද්වයට අදාළ වාක්‍යය වෙන් වශයෙන් උක්ත පද යොදා ලියයි.
- අත්තනො පදය හා පරස්ස පදය වෙන් වෙන්ව හඳුන්වයි.
- භවිස්සන්ති ආඛ්‍යාතයේ හා වර්තමාන ආඛ්‍යාතයේ ප්‍රත්‍යමාලාව සසඳයි.
- වර්තමාන හා අනාගත කාල දෙකෙහි අර්ථය වෙන් කර හඳුන්වමින් වාක්‍ය ලියයි.
- අතීත කාල (අජ්ජතනී) ප්‍රත්‍යමාලාව වගුගත කරයි.
- අතීත කාල ප්‍රත්‍යමාලාවට අනුව ධාතුවක් වරනගයි.
- වර්තමාන කාල වාක්‍යය ලියා ඒවා අතීත කාලයට හරවා ලියයි.
- නිර්දිෂ්ට කෘතියෙන් උපුටා දැක්වූ වර්තමාන, අජ්ජතනී, භවිස්සන්ති, ආඛ්‍යාත පද වර්ග කරයි.
- ඒ ඒ ආඛ්‍යාත පද යෙදුණු පාලි වාක්‍යය උපුටා අර්ථ කියයි, ලියයි.
- ආඛ්‍යාත පද යොදා සරල වාක්‍ය සාදයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- ආඛ්‍යාත පදයක් වරනැගෙන වගුව පැහැදිලි කළ යුතු බව.
- වර්තමාන කාල ආඛ්‍යාත ප්‍රත්‍යමාලාවට අනුව ධාතුවක් වරනැගිය යුතු බව.
- අනාගත කාල ප්‍රත්‍යමාලාව අනුව ධාතුවක් වරනගා දැක්විය යුතු බව.
- අජ්ජතනී ප්‍රත්‍යමාලාවට අනුව ධාතුවක් වරනගා දැක්විය යුතු බව.
- සරල වර්තමාන කාල වාක්‍යය 12ක් (පුරුෂ තුනට, පද දෙකට හා වචන දෙකට ගැලපෙන) ලියා ඒවා භවිස්සන්ති හා අජ්ජතනී විභක්තිවලට හැරවීම කළ යුතු බව.
- ඒ ඒ ආඛ්‍යාත පද යෙදුණු පාලි වාක්‍යය නිර්දිෂ්ට කෘතියෙන් උපුටා තේරුම ලිවිය යුතු බව.
- සරල පාලි වාක්‍ය ගොඩනැගිය යුතු බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- සුදුසු ප්‍රවේශයක් ලබාගන්න.
- වර්තමාන කාල විභක්ති ප්‍රත්‍ය වගුවක් සකස් කර ගන්න.
- එම වගුව සිසුන්ට පෙන්වා කරුණු විමසන්න.
- ධාතුවක් එම වගුවෙහි වරනගා දක්වන්න.

- එම වගුව භවිස්සන්ති ආඛ්‍යාතයට හරවන්න.
- එම වගුව අජ්ජතනී ආඛ්‍යාතයට හරවන්න.
- ආඛ්‍යාත පද මාලාවක් උපුටා පෙන්වන්න.
- එකිනෙකහි ඇති වෙනස්කම් හඳුන්වා දෙන්න.
- ඒවා වර්ග කරන්න.
- නිර්දිෂ්ට කෘතියෙන් උචිත වාක්‍ය තෝරා උපුටා දැක්වීමට සිසුන් යොමු කරන්න.
- උක්ත ආඛ්‍යාත පද සහිත වාක්‍ය නිර්මාණය කරවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ධාතුවක් වරනැගෙන වගුව ලියයි.
- වත්තමාන ආඛ්‍යාතයේ ධාතුවක් වරනගයි.
- වත්තමාන ආඛ්‍යාතයේ වාක්‍ය 12 ක් සඳහා උචිත උක්ත පද යොදයි.
- භවිස්සන්ති ආඛ්‍යාතය වරනගයි, අර්ථ කියයි.
- අජ්ජතනී ආඛ්‍යාතය වරනගයි, අර්ථ කියයි.
- සරල වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ආඛ්‍යාත ප්‍රත්‍යමාලාව සහිත පුවරු
- බහු මාධ්‍ය (මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර්) ප්‍රක්ෂේපණය,
- නාමාඛ්‍යාත වරනැගිල්ල
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- නාමාඛ්‍යාත වරනැගිල්ල
- පාලි පාඨමඤ්ජරී 1 පොත
- පාලි භාෂාවතරණය 1 පොත

# සන්ධි භාවිතය i

**04 නිපුණතාව**

පාලි භාෂාවේ සන්ධි භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4:1 සන්ධි හඳුන්වා සන්ධි කාර්යය පැහැදිලි කරයි.

4.2 සන්ධි ප්‍රභේද නම්කොට උදාහරණ දක්වයි.

**කාලච්ඡේද 02**

**ඉගෙනුම් පල**

- සන්ධි යනු මොනවාදැයි පැහැදිලි කරයි.
- සන්ධි ප්‍රභේද නම් කරයි.
- සන්ධියේ ප්‍රයෝජන දක්වයි.
- සන්ධි කාර්ය නම් කරයි.
- සන්ධි පද විසන්ධි කර, විසන්ධි පද සන්ධි කර දැක්වීමේ හැකියාව ලබයි.
- බාහිර හා අභ්‍යන්තර සන්ධියට නිදසුන් දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- අක්ෂර සුදුසු පරිදි ගළපා දෙපදයක් තනි පදයක් බවට පත් කිරීම සන්ධි නම් වන බව.
- බාහිර හා අභ්‍යන්තර වශයෙන් සන්ධි ප්‍රභේද දෙකක් ඇති බව.
- තනි පදයක් තුළ සන්ධිය නිත්‍ය වශයෙන් සිදුවන බව.
- පද දෙකක් අතර සිදුවන සන්ධිය බාහිර සන්ධිය වන බව.
- පද සන්ධි කිරීමෙන් ප්‍රයෝජන ඇති බව.
- සන්ධි කිරීම සඳහා සන්ධි කාර්ය යොදා ගතයුතු බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- සුදුසු ප්‍රවේශයක් ලබා ගන්න.
- සන්ධි යනු මොනවාදැයි පැහැදිලි කරන්න.
- බාහිර හා අභ්‍යන්තර සන්ධි ප්‍රභේද පැහැදිලි කරන්න.
- සන්ධි පද සහිත වාක්‍ය කිහිපයක් පුවරුවේ ලියා විසන්ධි කොට දක්වන්න.
- දෛනික වත්පිළිවෙත්වල භාවිත වන ගාථාවන්හි සන්ධි පද උපුටා දක්වන්න.

**තක්සේරුව හා ඇගයීම**

- සන්ධි යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- සන්ධි ප්‍රභේද නම් කරයි.
- සන්ධියේ ප්‍රයෝජන දක්වයි.
- සන්ධි කාර්ය නම් කරයි.
- බාහිර හා අභ්‍යන්තර සන්ධියට නිදසුන් දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෙල පොත /ඩී.වී.ඩී තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- බාලාවතාරය

# සන්ධි භාවිතය ii

**04 නිපුණතාව**

පාලි භාෂාවේ සන්ධි භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4.3 සන්ධි විධි යොදා ගනිමින් ස්වර සන්ධිය විස්තර කරයි.

**කාලච්ඡේද 02**

**ඉගෙනුම් පල**

- පාලියේ සන්ධි ප්‍රභේද නම් කරයි.
- ස්වර සන්ධියේ ලක්‍ෂණ හඳුන්වයි.
- සන්ධි විධි යොදා ගනිමින් විසන්ධි පද සන්ධි කරයි.
- සන්ධි පද විසන්ධි කොට දක්වයි.
- වාක්‍යවල ඇති ස්වර සන්ධි පද උපුටා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්‍ෂිප්තය*

- ස්වර සන්ධියේ පූර්ව හා පර වර්ණය ස්වරයක් වන බව.
- සන්ධි කාර්යේදී ව්‍යාකරණ විධි / සන්ධි විධි භාවිතයට ගත යුතු බව.
- වාක්‍යවල එන ස්වර සන්ධි පද උපුටා දැක්විය යුතු බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- උචිත ප්‍රවේශයක් ලබා ගන්න.
- ස්වර සන්ධි පද ඇතුළත් කොට සකසන ලද පාඨයක් පුවරුවේ ලියා දක්වන්න.
- එහි ඇති පද විසන්ධි කොට සන්ධි වූ අයුරු පැහැදිලි කරන්න.
- එහි දී සිදුවූ සන්ධි කාර්යය පැහැදිලි කරන්න.
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි ඇති ස්වර සන්ධි පද උපුටා දක්වන්න.
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි ඇති ස්වර සන්ධියට අයත් සන්ධි පද විසන්ධි කරන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ස්වර සන්ධියේ ලක්ෂණ දක්වයි.
- පාලි ස්වර සන්ධි විධි නම් කරයි.
- ස්වර සන්ධි පද විසන්ධි කොට දක්වයි.
- සන්ධි විධි යොදා පද සාධනය කරයි.
- ස්වර සන්ධි පද උපුටා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- සන්ධි පද ඇතුළත් කොට සකසන ලද පුවරුවක්
- ඩී.වී.ඩී.තැටියක්
- කලු/සුදු පුවරුව
- නිර්දිෂ්ට ග්‍රන්ථය

**වැඩිදුර ගවේෂණය**

- නිර්දිෂ්ට ග්‍රන්ථය
- බාලාවතාරය

# සන්ධි භාවිතය iii

**04 නිපුණතාව**

පාලි භාෂාවේ සන්ධි භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

4:4 වාක්‍ය නිර්මාණයේදී ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි පද භාවිත කරයි.

**කාලච්ඡේද 03**

**ඉගෙනුම් පල**

- ව්‍යඤ්ජන, නිග්ගහීත සන්ධි පද හඳුනා ගෙන ලියයි.
- දෙන ලද ඡේදයක ඇති ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි පද උපුටා දක්වයි.
- උපුටා දක්වන ලද සන්ධි පද නිවැරදිව විසන්ධි කරයි.
- දෙන ලද විසන්ධි පද සන්ධි කොට දක්වයි.
- සන්ධි පද භාවිත කරමින් සරල වාක්‍ය නිර්මාණය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- ව්‍යඤ්ජන සන්ධියේ දී පරවර්ණය ව්‍යඤ්ජනාක්ෂරයක් වන බව.
- ව්‍යඤ්ජනාක්ෂරයට ලෝප, ආදේශ, ආගම ආදි සන්ධි කාර්ය සිදුවන බව.
- සන්ධිවන පද දෙකෙන් පූර්ව වර්ණය බින්දුව නම් එම සන්ධිය නිග්ගහීත සන්ධිය වන බව.
- නිග්ගහීතයට ලෝප, ආදේශය, ආගම, යන සන්ධි කාර්ය සිදුවන බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- සුදුසු ප්‍රවේශයක් ලබාගන්න.
- ව්‍යඤ්ජන, නිග්ගහීත සන්ධි සහිත පද උපුටා දක්වන ලද පාඨයන් ප්‍රදර්ශනය කොට අදාළ සන්ධි පද හඳුනා ගැනීමට සහාය වන්න.
- හඳුනාගත් සන්ධි පද විසන්ධි කරන්න.
- පද සන්ධි වීමේ දී බලපෑ සන්ධි කාර්යය පැහැදිලි කරන්න.
- නිර්දිෂ්ට ග්‍රන්ථයෙන් සන්ධි පද උපුටා දැක්වීමට සිසුන් පොළඹවන්න.
- සන්ධි පද ඇතුළත් සරල වාක්‍ය නිර්මාණය කරන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි හඳුන්වයි.
- සන්ධි පද භාවිත කොට සරල වාක්‍ය නිර්මාණය කරයි.
- ඡේදයක ඇති ව්‍යඤ්ජන හා නිග්ගහීත සන්ධි පද උපුටා දක්වයි.
- උපුටා දැක්වූ පද විසන්ධි කරයි.
- විසන්ධි පද සන්ධි කොට දක්වා සන්ධි ප්‍රභේදය නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- සකසා ගත් වගුව • ඩී.වී.ඩී. තැටියක් • නිර්දිෂ්ට ග්‍රන්ථය

**වැඩිදුර ගවේෂණය**

- නිර්දිෂ්ට ග්‍රන්ථය • බාලාවතාරය

# පාලි සමාස i

**05 නිපුණතාව**

පාලි භාෂාවේ සමාස හා තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.

**5.1 නිපුණතා මට්ටම**

5:1 සමාස කෙටියෙන් හඳුන්වයි.

5.2 සමාසයේ ප්‍රයෝජන ලියා දක්වයි.

**කාලච්ඡේද 05**

**ඉගෙනුම් පල**

- සමාස පද යනු මොනවාදැයි හඳුන්වයි.
- සමාස පදයක පොදු ලක්ෂණ පැහැදිලි කරයි.
- සමාස පදයක අවයව වෙන්කර දක්වයි.
- යෝග්‍ය පද දෙකක් හෝ කිහිපයක් සමාස කොට දක්වයි.
- ඡේදයක ඇති සමාස පද උපුටා දක්වයි.
- සමාස ප්‍රයෝජන මතකයෙන් ලියයි, කියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- සමාස යනු පද කෙටි කිරීමක් බව
  (සමාසො පද සංඛෙපො)
- අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති පද පමණක් සමාස වන බව.
  (නාමානං සමාසො යුත්තත්ථො)
- සමාස පදයක අවයව දෙකක් හෝ වැඩි ගණනක් ඇති බව.
- පාලි භාෂාවේ බහුලව සමාස පද භාවිත වන බව.
- ඡේදයක ඇති සමාස පද හඳුනා ගතයුතු බව.
- සමාස කිරීමේ ප්‍රයෝජන දැන ගත යුතු බව.
- තෝරා ගත් සමාස පද කිහිපයක් ඇසුරින් ඉහත ප්‍රයෝජන පෙන්වා දිය හැකි බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- සමාස පද කිහිපයක් ලියා දක්වන්න.
- එකී සමාස පදවල අවයව වෙන් කරන්න.
- මුලින් ඇති අවයවයේ/ අවයව වල විභක්ති ප්‍රත්‍ය ලොප් ව ඇති බව පෙන්වා දෙන්න.
- අදාළ සමාස පද විග්‍රහ කොට දක්වන්න.
- සමාස කිරීමෙන් පසුව සමාස පද භාවිත කිරීමේ ප්‍රයෝජන පෙන්වා දෙන්න.
- සමාස පද සහිත හා රහිත වාක්‍ය කිහිපයක් ඉදිරිපත් කොට සිසුන්ට ඒ අතරින් සමාස පද හඳුනා ගැනීමට සලස්වන්න.
- සිසුන් කණ්ඩායම් කොට විග්‍රහ වාක්‍ය සහිත පද සපයා ඒවා සමාස කිරීමට අවස්ථාව සලසා දෙන්න.
- ඡේදයක ඇති සමාස පද කිහිපයක් උපුටා දක්වා ඒවා හඳුනා ගැනීමට අවස්ථාව සලසා දෙන්න.

**තක්සේරුව හා ඇගයීම**

- සමාස පදයක් උපුටා දක්වයි.
- සමාස පදයක පොදු ලක්‍ෂණ පෙන්වා දෙයි.
- සමාස පදයක අවයව වෙන් කොට දක්වයි.
- සමාස පදයක් හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කරයි.
- ගාථා, පාඨ, වාක්‍යවල එන සමාස පද උපුටා දක්වයි.
- සමාස ප්‍රයෝජන ලියයි, කියයි.

**ගුණාත්මක යෙදවුම්**

- උපුටා දක්වන ලද ඡේදයක්.  ඩී.වී.ඩී.තැටියක්
- උපුටා දක්වන ලද ගාථා කිහිපයක්
- උපුටා දක්වන ලද වාක්‍ය කිහිපයක්

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය II පොත.
- පාලි ව්‍යාකරණ විවරණය.
- බාලාවතාරය  සමාස කාණ්ඩය.

# පාලි සමාස ii

**05 නිපුණතාව**

පාලි භාෂාවේ සමාස හා තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.3 ඒ ඒ සමාස ප්‍රභේදය සඳහා උදාහරණය බැගින් දක්වයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- සමාස ප්‍රභේද 6 ක් ඇති බව ප්‍රකාශ කරයි.
- ඒ ඒ සමාස ප්‍රභේදයට උදාහරණය බැගින් සපයයි.
- අවයව ලක්ෂණ අනුව සමාස පදය කවර සමාසයකට අයත් දැයි ප්‍රකාශ කරයි .
- ඒ ඒ සමාස ප්‍රභේදයට අනන්‍ය මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- එක ම සමාස ප්‍රභේදයක වුව ද වෙනස්කම් ඇති බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- දෙනු ලබන සමාස පද සමාස ප්‍රභේද අනුව වගුගත කොට දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- සමාස ප්‍රභේද 6 ක් ඇති බව.
- ඒ ඒ සමාස ප්‍රභේදයට අනන්‍ය වූ මූලික ලක්ෂණ ඇති බව.
- ඒ ඒ ප්‍රභේදයේ අනන්‍යතාව තහවුරු කිරීමට උදාහරණ දැක්විය යුතු බව.
- අවයව අනුව සමාස පදය කිනම් සමාසයකට අයත් වන්නේ ද යන වග කිව හැකි බව.
- එක ම සමාස පදයක වුව ද වෙනස්කම් පවතින බව.
- සමාස පද සුලභ ව පාලි භාෂාවේ භාවිත වන බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- සමාස පද කිහිපයක් ලියා දක්වා අවයව වෙන් කරන්න.
- ඒ ඒ සමාස පදයේ වෙස්කම් පෙන්වා දෙන්න.
- ඒ අනුව සමාස ප්‍රභේදය නම් කරන්න.
- සමාස පද කිහිපයක් ලියා දක්වා ඒවා ඒ ඒ සමාස ප්‍රභේදයට අයත් බව පෙන්වා දෙන්න.
- දෙනු ලබන සමාස පද කවර සමාසයකට අයත් දැයි නම් කිරීමට ඉඩ සලසන්න.

**තක්සේරුව හා ඇගයීම**

- සමාස පද කිහිපයක් උපුටා දක්වයි.
- සමාස ප්‍රභේද මතකයෙන් කියයි, ලියයි.
- ඒ ඒ සමාස ප්‍රභේදයට උදාහරණය බැගින් සපයයි.
- දෙනු ලබන ඡේදයක ඇති සමාස පද උපුටා දක්වා ප්‍රභේදය නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- සකස් කරන ලද සමාස ප්‍රභේද ඇතුළත් වගුව
- කලු/ සුදු පුවරුව
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය II පොත
- පාලි ව්‍යාකරණ විවරණය
- බාලාවතාරය සමාස කාණ්ඩය

# පාලි තද්ධිත

**05 නිපුණතාව**

පාලි භාෂාවේ සමාස හා තද්ධිත හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

5.4 තද්ධිත හඳුන්වා දීමට සමත් වෙයි.

5.5 තද්ධිත ප්‍රභේද නම් කොට උදාහරණය බැගින් දක්වයි.

**කාලච්ඡේද 05 යි.**

**ඉගෙනුම් පල**

- නාමයකට තද්ධිත ප්‍රත්‍යයක් එක් කොට තද්ධිත නාමයක් සාදා ගන්නා බව ප්‍රකාශ කරයි.
- තද්ධිත යනු ප්‍රත්‍යාර්ථ නාම බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- ලේඛනයේ දී හා භාෂණයේදී තද්ධිත පද බහුල වශයෙන් යොදා ගන්නා බව ප්‍රකාශ කරයි .
- තද්ධිත ප්‍රභේද නම් කර උදාහරණ සපයයි.
- නාමයකට තද්ධිත ප්‍රත්‍යයක් එක් කොට තද්ධිත පද සාදයි.
- තද්ධිත පදයන්හි නාමය හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කර දක්වයි.
- දෙනු ලබන තද්ධිත නාම ඒ ඒ ප්‍රභේදයට අයත් වන ලෙස වර්ගගත කරයි.
- ඡේදයක ඇති තද්ධිත පද උපුටා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- නාමයන්ට හිත වූ තද්ධිත ප්‍රත්‍යය සමූහයක් ඇති බව.
- විවිධ තද්ධිත ප්‍රත්‍යය නිසා තද්ධිත ප්‍රභේද ගොඩනැගෙන බව.
- එක් එක් තද්ධිත ප්‍රභේදයට අනන්‍ය වූ ලක්ෂණ ඇති බව.
- නාමයකට පරව තද්ධිත ප්‍රත්‍යයක් යොදා තද්ධිත නාමයක් සාදාගත හැකි බව.
- තද්ධිත ප්‍රභේද 6 ක් ඇති බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- තද්ධිත නාම සහිත වාක්‍යය කිහිපයක් පුවරුවේ ලියා දක්වන්න.
- එම වාක්‍යවල ඇති තද්ධිත පද උපුටා දක්වන්න.
- තද්ධිත පදවල නාමය හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කිරීම, සිසුන් ලවා කරවන්න.
- තද්ධිත පද කිහිපයක් ලබා දී ඒවා කවර තද්ධිත ප්‍රභේදයකට අයත් දැයි විමසා වර්ගගත කරවන්න.
- ඡේදයක / වාක්‍යයක ඇති තද්ධිත පද උපුටා දක්වන්න.
- තද්ධිත ප්‍රභේද උදාහරණ සහිත ව මතකයෙන් කියවන්න/ලියවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- තද්ධිත පදයක ලක්ෂණ පැහැදිලි කරයි.
- තද්ධිත පද හඳුන්වා දෙයි.
- තද්ධිත පදයක නාමය හා තද්ධිත ප්‍රත්‍ය වෙන් කර දක්වයි.
- තද්ධිත ප්‍රභේද මතකයෙන් කියයි, ලියයි.
- ඒ ඒ තද්ධිත ප්‍රභේදයට උදාහරණය බැගින් සපයයි.
- තද්ධිත නාම කවර ප්‍රභේදයකට අයත් දැයි ප්‍රකාශ කරයි.
- ජේදවල / වාක්‍යවල ඇති තද්ධිත පද උපුටා දක්වා වර්ගගත කරයි.
- ව්‍යවහාරයේ පවතින පාලි තද්ධිත පද එකතු කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- සකසා ගත් වගු
- පාලි භාෂාවතරණය II පොත (තද්ධිත)
- කලු/ සුදු පුවරුව
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- පාලි ව්‍යාකරණ විවරණය
- පාලි භාෂාවතරණය II පොත

## පාලි ගද්‍ය පරිවර්තනය i

**06.නිපුණතාව**

නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6.1 සරල පාලි පාඨ සිංහලයට නගයි.

**කාලච්ඡේද 04**

**ඉගෙනුම් පල**

- වාක්‍යයක මූලික රීති පැහැදිලි කරයි.
- පාලි පාඨයක් සිංහලයට පරිවර්තනය කිරීමේ දී සිදුවන මූලික රීති විස්තර කරයි.
- පාලි වාක්‍යයක කාල භේදය, වචන භේදය හා පුරුෂ භේදය පැහැදිලි කරයි.
- සරල පාලි වාක්‍ය සිංහලට නැගීමේ හැකියාව ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- කාල භේදය, පුරුෂ භේදය, වචන භේදය පහත වාක්‍ය සමුහය මගින් පැහැදිලි කළ හැකි බව.
- මුනි මඤ්චේ සයති / සයි / සයිස්සති
- මුනයො මඤ්චෙසු සයන්ති / සයිංසු / සයිස්සන්ති.
- අහං දීපෙ චරාමි / අචරිං / චරිස්සාමි.
- මයං දීපෙ චරාම / අචරිම්හ / චරිස්සාම
- ත්වං අතිථිනො ආහාරං දදසි / දදො / දදිස්සසි.
- තුම්හෙ අතිථිනො ආහාරං දදථ / දදිත්ථ / දදිස්සථ.
- පාලි භාෂාවතරණය 1 - 10 පාඩම්වල පාලියෙන් සිංහලයට ඇති වාක්‍ය යොදා ගෙන ඉහත කරුණු සාකච්ඡා කළ යුතු බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- වාක්‍යයක කර්තෘ, කර්ම, ක්‍රියා වශයෙන් අවම පද තුනක් ඇති බව පැහැදිලි කර දෙන්න.
  බාලකො සුනඛං පහරති.
- වාක්‍යයේ ක්‍රියා පදයේ කාලය වෙනස් කළ විට වාක්‍යයේ සම්පූර්ණ අදහස වෙනස් වන බව පැහැදිලි කරන්න.
  බාලකො සුනඛං පහරති
  බාලකො සුනඛං පහරි
- දුරවබෝධ පාලි වචන සඳහා සිංහලාර්ථ සපයන්න.
- මාරෙසි - මැරුවේය / පීළෙසි - පෙලුවේය / ජාලෙසි - දැල්වීය
  කථෙසි - කීවේය / දෙසෙසි - දේශනා කළේය / පාතෙසි - හෙලුවේය
  චොරෙසි - සොරකම් කළේය /ඨපෙසි - තැබුවේය / ආනෙසි - ගෙනාවේය
  ඉහත ක්‍රියාපදවල වර්තමාන හා අනාගත කාල ක්‍රියා පද පිළිබඳ අවධානය යොමු කරවන්න.
- සකසන ලද පුවරුවේ හෝ කලු / සුදු ලැල්ල මත වාක්‍ය ලියා සිසුන් ලවා උච්චාරණය කරවන්න.
- වාක්‍යයේ කර්තෘ කර්ම ක්‍රියා පදවලට විශේෂණ පද යොදා වාක්‍ය සංකීර්ණ කළ හැකි බව හා විශේෂණ පද, අදාළ පදයට මුලින් යෙදෙන බව පැහැදිලි කරන්න.
  ගාමවාසී සො මුනි, නීචමඤ්චෙ සාධුකං සයති.

- පාලි භාෂාවතරණය පළමු පොතේ  01- 10 පාඩම්වල තෝරාගත් පාලි වාක්‍ය සිංහලයට පරිවර්තනය කරවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- පාලි භාෂාවතරණය පළමු පොතේ  1-10 පාඩම්වල තෝරාගත් පාලි වාක්‍ය සිංහලයට නගයි.
- වර්තමාන කාල  වාක්‍යයක් අතීත හා අනාගත කාලවලට හරවා ලියයි.
- ඒක වචනාර්ථවත් පාලි වාක්‍ය බහු වචනයට හරවා ලියයි.
- කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍ය සුදුසු විශේෂණ පද යොදා ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි භාෂාවතරණය I පොත
- වාක්‍යයක කාල භේදය, පුරුෂ භේදය, වචන භේදය ප්‍රකට වන ලෙස සැකසූ වගුවක්

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය I පොත

## පාලි ගද්‍ය පරිවර්තනය ii

**06 නිපුණතාව**

නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6:2 සරල සිංහල පාඨ පාලියට නගයි.

**කාලච්ඡේද 04**

**ඉගෙනුම් පල**

- සිංහල පාඨයක් පාලියට නැඟීමේදී සිදුවන මූලික රීති විස්තර කරයි.
- සිංහල වාක්‍යයක මූලික ලක්ෂණ පැහැදිලි කරයි.
- වාක්‍යයක කාල, වචන, පුරුෂ භේද ලියා විස්තර කරයි.
- සරල සිංහල පාඨ පාලියට නගයි.
- ඒක වචන වාක්‍ය බහු වචනයටත් බහු වචන වාක්‍ය ඒක වචනයටත් හරවයි.
- අර්ථවත් පාලි වාක්‍ය කාලත්‍රයෙන් ම ලියා දැක්වීමට සමත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- සරල වාක්‍යක මූලික ලක්ෂණ හඳුනා ගත යුතු බව.
- වාක්‍ය කාලත්‍රයේ, පුරුෂත්‍රයේ, වචනද්වයේ යෙදෙන බව.
- පාලි භාෂාවතරණය පළමු පොතේ 01 - 10 පාඩම්වල තෝරාගත් සිංහල පාඨ පාලියට නැගිය යුතු බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- උචිත ප්‍රවේශයක් ලබා ගන්න.
- සරල සිංහල වාක්‍යයක කර්තෘ, කර්ම, ක්‍රියා පැහැදිලි කර දෙන්න.
- එම කර්තෘ කර්ම ක්‍රියා පද අදාළ වචනයෙන් විභක්තියෙන්, පුරුෂයෙන් යෙදිය යුතු බව පෙන්වා දෙන්න.
- සිංහල වාක්‍යයක් පාලියට පරිවර්තනය කිරීමේදී පාලි රීතිය බලපැවැත්වෙන බව පැහැදිලි කරන්න.
- වාක්‍යයක ක්‍රියා පදයේ කාලය වෙනස් කළ විට මුළු වාක්‍යයේ ම අර්ථය වෙනස් වන බව පැහැදිලි කරන්න.
- විශේෂණ පද යෙදීමෙන් වාක්‍ය සංකීර්ණ වන බව පැහැදිලි කිරීම හා එකී විශේෂණ අදාළ පදයට මුලින් යෙදිය යුතු බව පෙන්වා දෙන්න.
- පාලි භාෂාවතරණය 1 පොත 1 - 10 පාඩම්වල තෝරාගත් සිංහල පාඨ පාලියට පරිවර්තනය කරවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- පාලි භාෂාවතරණය පළමු පොතේ 1-10 පාඩම්වල තෝරාගත් සිංහල වාක්‍ය පාලියට නගයි.
- වර්තමාන කාල සිංහල වාක්‍ය අතීත හා අනාගත කාලවලට හරවා ලියයි.
- ඒක වචනාර්ථවත් වාක්‍ය බහු වචනාර්ථයට හරවා ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි භාෂාවතරණය 1 පොත
- වාක්‍යයක කාලත්‍රය, පුරුෂත්‍රය, වචනද්වය ප්‍රකට වන ලෙස සැකසූ වගුව

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය 1 පොත

## පාලි ගද්‍ය පරිවර්තනය iii

**06 නිපුණතාව**

නිවැරදි වියරණ විධි සහිත ව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

6.3 ව්‍යාකරණානුකූල ව සරල පාලි ඡේද සිංහලයට නගයි.

**කාලච්ඡේද 02**

**ඉගෙනුම් පල**

- සරල පාලි වාක්‍ය අර්ථ පූර්ණ ලෙස සිංහලට නගයි.
- සිංහලට පරිවර්තනය කිරීමේ දී බලපාන රීති පැහැදිලි කරයි.
- භාෂා රීති අනුගමනය කරමින් සරල පාලි ඡේද නිවැරදි ව සිංහලට නගයි.
- සිංහලට නැගූ පාඨයේ සාරාංශය ගෙන හැර දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- මෙම නිර්දිෂ්ට ඡේදය පාලි රචනා එක පොතේ ''කුක්කුටො'' පාඩම බව.
- මෙම ඡේදය සරල පාලි ඡේද පරිවර්තනයට පූර්වාදර්ශ සපයන බව.
- මෙම පාඩමෙන් පරිවර්තන කුසලතාව හා ජීවිතාදර්ශ ගතහැකි බව.

**කුක්කුටො**

මනුස්සානං කුක්කුටො උපකාරකො. තස්මා බහවො මනුස්සා කුක්කුටෙ පොසෙන්ති. කුක්කුටා ධඤ්ඤකණාදීනි භුඤ්ජන්ති. දිවා භාගෙ ගෙහස්ස අවිදූරෙ ඉතොචිතො ආහිණ්ඩන්ති. සූරියෙ අත්ථං ගච්ඡන්තෙ තෙ නිවාසං ආගච්ඡන්ති. රත්තියං රුක්ඛෙසු වා පඤ්ජරෙසු වා සයන්ති. තෙ සබ්බෙසං ජනානං පඨමතරං පබුජ්ඣිත්වා රවන්ති. තෙන සද්දෙන මනුස්සා පබුජ්ඣන්ති. කාලං අඤ්ඤාය පාතොව සකෙ සකෙ කම්මෙ නියුජ්ජන්ති, කුක්කුටස්ස සිරසි චූලා වත්තතෙ. තථා න කුක්කුටියා සිරසි. තතො කුක්කුටියා අධිකතරං කුක්කුටො සොභතෙ. කුක්කුටියා අණ්ඩෙහි සාබකා උප්පජ්ජන්ති. කුක්කුටපොතකා කුක්කුටියා සද්ධිං සඤ්චරන්ති අපි නු ත්වං ඉච්ඡසි කුක්කුටෙ පොසෙතුං

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- උචිත ප්‍රවේශයක් ලබා ගන්න.
- දුරවබෝධ වචන සඳහා සිංහලාර්ථ සපයන්න.
- පාඨය ඇසීමට සලස්වන්න.
- පාඨයේ අන්තර්ගත සාරාංශය ඉදිරිපත් කරන්න.
- පාලි පාඨයේ සිංහල අර්ථය පරිවර්තන රීති අනුව තේරුම් කරන්න.
- මෙබඳු තවත් පාඨ එකතු කිරීමට පොළඹවන්න.
- පාඨය ආශ්‍රයෙන් සිංහලයෙන් හා පාලියෙන් සරල ප්‍රශ්න අසන්න.

**තක්සේරුව හා ඇගයීම**

- දෙන ලද ඡේදය සිංහලයට නගයි.
- පාලියෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- අසම්පූර්ණ වාක්‍ය සම්පූර්ණ කොට ලියයි.
- දෙන ලද වචන යොදා සරල වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- කුක්කුටො පාඩම (පාලි රචනා 1 පොත)
- කුකුළා, කිකිළිය, පැටවි සහිත ඡායාරූප

**වැඩිදුර ගවේෂණය**

- පාලි රචනා 1 පොත

## පාලි පද්‍ය පරිවර්තන

**07 නිපුණතාව**

නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් කියවයි.

**නිපුණතා මට්ටම**

7.1 නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ නිවැරදිව උච්චාරණය කරයි.

7.2 නිර්දිෂ්ට පද්‍ය පාඨයක් රිද්මයානුකූලව ගායනා කරයි.

7.3 ගද්‍ය පද්‍ය පාඨයන්හි සරල අර්ථය ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 10**

**ඉගෙනුම් පල**

- පාලි ගාථා ශබ්ද නගා නිවැරදි ව උච්චාරණය කරයි.
- පාලි ගාථා රිද්මයානුකූලව ගායනා කරයි.
- සාම්ප්‍රදායානුකූල ව සජ්ඣායනා කරයි.
- ගද්‍ය පද්‍ය පාඨයන්හි අන්වය සකසයි.
- ගද්‍ය පද්‍ය පාඨයන්හි දුරවබෝධ පදවලට අර්ථ ලියා දක්වයි.
- අන්වයට අනුව අර්ථය කියයි, ලියයි.
- අර්ථාවබෝධයෙන් යුතුව කියවා රසවිඳියි.
- ගද්‍ය පද්‍ය පාඨයන් හි ඇති පදවල ව්‍යාකරණ විභාග විස්තර කරයි.
- ගද්‍ය පද්‍ය කොටස්වල සරල අර්ථය සංක්ෂිප්ත කර දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- ධම්මපදයේ අප්පමාද වග්ගයේ ගාථා ශබ්ද නගා කියවිය යුතු බව.
- ගාථා රිද්මයානුකූලව ගායනා කළ යුතු බව.
- ගාථාවල අන්වය සකසා සරලාර්ථ තේරුම් ගත යුතු බව.
- දුරවබෝධ පදවල අර්ථය ලිවිය යුතු බව.
- ගාථාවල ධර්මාර්ථ අවබෝධයෙන් ප්‍රකාශ කළ යුතු බව.
- මහාසුපින ජාතකයේ නිර්දේශිත කොටස ( පළමු ඡේද 03) හඬනගා කියවිය යුතු බව.
- දුරවබෝධ පදවල අර්ථය ලිවිය යුතු බව.
- අන්වයට අනුව අර්ථ කීම හා ලිවීම කළ යුතු බව.
- සාහිත්‍යාත්මක යෙදුම් පැහැදිලි කර දිය යුතු බව.
- තෝරාගත් පදවල ව්‍යාකරණාංග නම් කළ යුතු බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- නිර්දිෂ්ට කොටස් සාම්ප්‍රදායානුකූලව උච්චාරණය කර පෙන්වන්න.
- සිසුන් ලවා එය අනුකරණයට සලස්වන්න.
- දුරවබෝධ පද උපුටා දැක්වීමට සිසුන් යොමු කරන්න.
- එම පදවල අර්ථ පැහැදිලි කරන්න.
- අන්වය සැකසීමට අවශ්‍ය උක්තාඛ්‍යාත ප්‍රයෝග පිළිබඳ අවබෝධය ලබා දෙන්න.
- සිසුන් ලවා අර්ථය කියවන්න, ලියවන්න.
- ජාතක කථා කොටස අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය ප්‍රකටවන ලෙස කියවන්න.
- එහි දුරවබෝධ පද පැහැදිලි කරන්න.

- නියමිත ඡේදවල අර්ථ කියවන්න, ලියවන්න.
- සාහිත්‍යාත්මක යෙදුම් පැහැදිලි කරන්න.
- තෝරාගත් පදයන් හි ව්‍යාකරණ විභාගය විස්තර කරන්න.
- ගද්‍ය පද්‍ය පාඨයන්හි ධර්මාර්ථ පැහැදිලි කරන්න.
- ධර්මෝපදේශ හා චරිතාදර්ශ ලියවන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ගද්‍ය පද්‍ය පාඨ සාම්ප්‍රදායානුකූල ව සජ්ඣායනා කරයි
- දුරවබෝධ පදයන්හි අර්ථ ලියයි, කියයි.
- උපමා ආදී යෙදුම් උපුටා ලියයි.
- ධර්මාර්ථ පැහැදිලි කරමින් නම් කරයි.
- උද්ධෘත පදයන්හි ව්‍යාකරණාංග නම් කරයි

**ගුණාත්මක යෙදවුම්**

- ජාතකට්ඨ කථාව (මහාසුපින ජාතකය - පළමු ඡේද 03)
- ධම්මපදය (අප්පමාද වග්ගය)
- ඩී.වී.ඩි තැටියක්
- මහාසුපින ජාතකය- සී.ඩී. තැටිය

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාව 10-11 පොත (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)
- ජාතකට්ඨ කථාව

## පාලි භාෂාව ප්‍රායෝගික භාවිතය

**08 නිපුණතාව**

පාලි භාෂාව ප්‍රායෝගික ව භාවිත කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම**

8.1 ජීවිතයේ විවිධ අවස්ථාවල ප්‍රායෝගික ලෙස පාලි භාෂාව භාවිත වන බව ප්‍රකාශ කරයි.

8.2 දිනපතා අදහස් හුවමාරු කරගැනීමට පාලි භාෂාව යොදා ගනියි.

8.3 පාලි භාෂාවෙන් ඇති ආදර්ශ පාඨ අවස්ථාවෝචිතව භාවිත කරයි.

**කාලච්ඡේද 10**

**ඉගෙනුම් පල**

- පන්සිල් පදවල අර්ථය කියයි.
- සුලභව භාවිත වන වන්‍දනා ගාථාවල අර්ථය කියයි, ලියයි.
- අවමංගල දැන්වීම්වල එන පාඨ එකතු කරයි. ඒවායේ අර්ථ ලියයි.
- විවිධ ආයතනවල එන ආදර්ශ පාඨ එකතු කරයි, ලියයි.
- පාලියෙන් සරල ලෙස සුභ පැතීම ආදි වාක්‍ය භාවිත කරමින් සංවාදයේ යෙදෙයි.
- නිර්දිෂ්ට පාඩමේ සංවාදයට අනුව සංවාදයක් නිර්මාණය කරයි.
- පාලි සාහිත්‍යයේ එන අවස්ථා සංවාදයට නගයි.
- ධම්මපදය, ජාතකපාලිය පොත්වලින් ආදර්ශ පාඨ උපුටා ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

- යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි, පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

*නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය*

- නිර්දිෂ්ට පාඩම් ශබ්ද නගා කියවිය යුතු බව.
- පාලි භාෂාවෙන් සංවාදයක් ගොඩ නැගිය යුතු බව.
- පන්සිල් හා වන්දනා ගාථා වල තේරුම් කියාදිය යුතු බව.
- ආදර්ශ පාඨ රැස් කළ යුතු බව.
- බෞද්ධ කථා පාලියෙන් නාට්‍යානුරූපීව ඉදිරිපත් කළ යුතු බව.
- සුබ පැතීම, ලෙඩ දුක් විමසීම (බොජ්ඣංග සූත්‍රය) ආදිය සඳහා පාලි භාෂාව භාවිත කළ යුතු බව.

*යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය*

- පාලි සංවාදයක් පරිගණක ප්‍රක්ෂේපණයක් මගින් පෙන්වා ප්‍රවේශයක් ලබාගන්න.
- ආගමික වත්පිළිවෙත් පාලියෙන් කෙරෙන අයුරු පෙන්වා දෙන්න.
- ආගමික වත්පිළිවෙත්හි යෙදෙන පාලි පාඨයන්හි අර්ථ පැහැදිලි කරන්න.
- නිර්දිෂ්ට පාඩම සංවාදයක ස්වරූපයෙන් ළමුන් ලවා ඉදිරිපත් කරන්න.
- ඒ ඒ ආයතනවල ඇති ආදර්ශ පාඨ රැස්කොට තේරුම් ලියන්න.

**තක්සේරුව හා ඇගයීම**

- ජීවිතයේ බහුල ලෙස ව්‍යවහාර කෙරෙන පාලි ගාථාවල තේරුම කියයි.
- ආගමික අවස්ථාවන්හි යෙදෙන පාලි පාඨයන්හි අර්ථ ලියයි.
- ආදර්ශ පාඨ රැස් කරයි. අර්ථ දක්වයි.
- පාලියෙන් සංවාදයේ යෙදෙයි.
- පාලියෙන් සුබපතයි, ලෙඩදුක් විමසයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පොත
- Aids to pali Conversation and translation
- මල්ටිමීඩියා පොජෙක්ටර්,
- ජාතකපාලිය, • ධම්මපදය
- ඩී.වී.ඩී. තැටියක්

**වැඩිදුර ගවේෂණය**

- පාලි පාඨමඤ්ජරී 1 පොත
- පාලි භාෂාවතරණය 1 පොත

# තක්සේරුව හා ඇගයීම

පන්ති කාමරය තුළ ඵලදායී ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස ගුරු මහත්ම මහාත්මීන් සිසුන් ලබා සිටින ප්‍රාප්ති මට්ටම් සහ ඔවුන් මුහුණපා සිටින ඉගෙනුම් දුෂ්කරතාවන් පිළිබඳ සුවිශේෂී ලෙස අවබෝධ කරගෙන සිටීම අත්‍යවශ්‍යය. එය එක් එක් ශිෂ්‍යයා හට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම පුළුල් අරමුණෙන් යුතුව පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ නිරන්තරයෙන් තොරතුරු රැස්කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම යනුවෙන් සරලව හැඳින්විය හැකිය.

තක්සේරු කිරීමේ විවිධ භාවිතයන් ඇත. තේරීම් කාර්යය, ස්ථාපන කාර්යය, පර්යේෂණ කාර්යය ඒ අතරින් ප්‍රධානය. එහෙත් පන්ති කාමරය තුළ ගුරුවරයෙකුට සිසුන්ගේ ඉගෙනීමේ ගැටළු අනාවරණය කරගෙන අපේක්ෂිත ඉගෙනුම් මට්ටම් කරා සිසුන් නියාමනය කිරීම සඳහා අත්‍යවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම පිණිස එය ප්‍රයෝජනවත් වේ. තක්සේරු කිරීම පන්ති කාමරය තුළ ක්‍රියාත්මක විය යුත්තේ එම පුළුල් අරමුණෙන් යුතුවය.

පන්ති කාමරය තුළ කරනු ලබන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය දෙයාකාරයකට ක්‍රියාත්මක කළ හැකිය. එනම් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනුම අඛණ්ඩ ලෙස සම්භවන ආකාරයට ක්‍රියාත්මක කිරීම සහ වසරක්, වාරයක්, පාඩම් ඒකකයක්, තේමාවක් ලෙස සම්පිණ්ඩිත ආකාරයට තක්සේරු කිරීමත් ය. මෙම ගුරු මාර්ගෝපදේශයේ සෑම ඉගෙනුම් නිපුණතා මට්ටමක් අවසානයේ ම එම පාඩමින් සිසුන් විසින් සංවර්ධනය කරගත යුතු කුසලතා සැලකිල්ලට ගෙන තක්සේරු කිරීමේ නිර්ණායක ඉදිරිපත් කර ඇත. පහත දැක්වෙන්නේ ඒ සඳහා උදාහරණයකි.

**නිපුණතා මට්ටම**

4.3 සන්ධි විධි යොදා ගනිමින් ස්වර සන්ධිය විස්තර කරයි.

**තක්සේරුව හා ඇගයීම**

- ස්වර සන්ධියේ ලක්ෂණ දක්වයි.
- පාලි ස්වර සන්ධි ප්‍රභේද නම් කරයි.
- ස්වර සන්ධි පද විසන්ධි කොට දක්වයි.
- සන්ධි විධි යොදා පද සාධනය කරයි.
- ස්වර සන්ධි පද උපුටා දක්වයි.

පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන අතරතුර මෙම ඉගෙනුම් මට්ටම් කරා සිසුන් පැමිණ තිබේ ද?. නැතහොත් ඔවුන් දුෂ්කරතාවන් පෙන්නුම් කරන්නේ ද? යන්න හඳුනා ගනිමින් කටයුතු කිරීමට ගුරුවරයෙකුට පුළුවන. මෙ වැනි සම්භවන තක්සේරු කිරීමේ ක්‍රියාවලියකදී ගුරුවරයෙකුට සිසුන් හඳුනා ගැනීම පිණිස, සිසුන්ගේ වැඩ නිරීක්ෂණය කිරීම හා සිසුන් සමග සාකච්ඡා කිරීම වැනි අවිධිමත් තක්සේරු කිරීමේ ක්‍රම භාවිතයට ගත හැකිය. එයට අමතරව රචනා ලියවීම පෙළපොතේ අභ්‍යාසවලට දෙන පිළිතුරු ඇගයීමට ලක්කිරීම වැනි ක්‍රමවේදයන් ද භාවිතයට ගත හැකිය. එසේ ම දෙවනුවට සඳහන් කළ සම්පිණ්ඩිත තක්සේරු කිරීම සඳහා මාසයක්, වාරයක්, අවුරුද්දක් අවසානයේ පවත්වන පරීක්ෂණ හෝ මෙම ගුරු මාර්ගෝපදේශයේ ඉදිරිපත් කොට ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරකය නිදර්ශකයක් ලෙස භාවිත කරමින් සකස් කරගන්නා ආධාරක යොදා ගත හැකිය.

සිසුන් තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ යොදාගන්නා විට තමා විසින් ම සකස් කරගනු ලබන පරීක්ෂණ උපයෝගී කරගන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත. පන්ති කාමරය තුළ කරන සිසු ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස වඩාත් වලංගුතාවකින් යුක්ත වන්නේ අදාළ ගුරුවරුන් විසින් සකස් කර ගනු ලබන පරීක්ෂණය. ගුරු මහත්ම මහත්මීන් ඒ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගත යුතුය.

මෙම පසු බිම යටතේ පන්ති කාමරය තුළ කෙරෙන සිසු ප්‍රගතිය තක්සේරු කිරීම සිසුන් හොඳින් හඳුනා ගෙන එක් එක් සිසුවාට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් ලබා දී අපේක්ෂිත ඉගෙනුම් පල කරා ඔවුන් නියාමනය කිරීමේ මූලික පරමාර්ථය පෙරදැරි කර ගෙන ක්‍රියාත්මක විය යුතුය.

එක් එක් නිපුණතා මට්ටම්වලට අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු අනුපිළිවෙළ සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ එක් ආධාරකයක් නිදර්ශකයක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශයේ ඉදිරිපත් කොට ඇත. එය අනුසාරයෙන් ඒ ඒ වාරවලට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක ගුරුවරයා විසින් ම උචිත පරිදි සකස් කර ගතයුතුය.

**ඒ ඒ වාර සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු**

**අනුපිළිවෙළ (නිපුණතා මට්ටම් අනුව)**

| වාරය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු නිපුණතා මට්ටම්වල අනුපිළිවෙළ | 1 වන ඇගයීම් අවස්ථාව | 2 වන ඇගයීම් අවස්ථාව | 3 වන ඇගයීම් අවස්ථාව |
|---|---|---|---|---|
| 1 වාරය | 1.1,<br>1.2,<br>1.3,<br>2.1,<br>2.2,<br>2.3,<br>2.4,<br>3.1 | 1.1,<br>1.2,<br>1.3, | 2.1,<br>2.2,<br>2.3, | 2.4,<br>3.1 |
| 2 වාරය | 3.2,<br>3.3,<br>4.1,<br>4.2,<br>4.3,<br>4.4,<br>5.1,<br>5.2,<br>5.3,<br>5.4,<br>5.5 | 3.2,<br>3.3, | 4.1,<br>4.2,<br>4.3,<br>4.4 | 5.1,<br>5.2,<br>5.3,<br>5.4,<br>5.5 |
| 3 වාරය | 6.1<br>6.2,<br>6.3<br>7.1,<br>7.2<br>7.3,<br>8.1,<br>8.2,<br>8.3 | 6.1,<br>6.2,<br>5.3 | 7.1<br>7.2,<br>7.3 | 8.1<br>8.2,<br>8.3, |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය :- දෙවන වාරය
2. ආධාරක අංකය. :- 01
3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්. :- 5.1, 5.2, 5.3
4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය. :-
   - සමාස හැඳින්වීම.
   - සමාස ප්‍රයෝජන
   - සමාස ප්‍රභේද
5. ආධාරකයේ ස්වභාවය :- පැවරුම
6. ආධාරකයේ අරමුණු :-
   - පාලි භාෂාවේ සමාස පිළිබඳ මූලික අවබෝධයක් ලබා දීම.
   - සමාසවල ප්‍රයෝජන දැන ගැනීම.
   - සමාස පදවල අවයව හඳුනා ගැනීම
   - සමාස ප්‍රභේද ඉගැනීම.
   - ඒ ඒ සමාස ප්‍රභේදවලට උදාහරණ සැපයීම
   - සමාස පද උපුටා ගැනීමේ කුසලතාව ඇති කිරීම
7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.

**7.1ගුරු උපදෙස්** :-

- සමාස යනු මොනවාදැයි පැහැදිලි කරන්න.
- සමාසවල ප්‍රයෝජන දක්වන්න.
- සමාස පදවල අවයව විග්‍රහ කොට දක්වන්න.
- සමාස ප්‍රභේද නම් කොට ඒවාට නිදර්ශක සපයන්න.
- සමාස පද සහිත ඡේදයක් ලබා දී සමාස පද උපුටා දක්වා දැනුම තහවුරු කරන්න.

- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි පාඩම් 2ක් නම් කොට එහි එන සමාස පද උපුටා සමාස ප්‍රභේද නම් කිරීමට සිසුන් යොමු කරන්න.
- ලකුණු දීමෙ නිර්ණායක පිළිබඳ දැනුවත් කරන්න.
- නිර්ණායකවලට අදාළව ලකුණු පිරිනමන්න.

7.2 **සිසු උපදෙස්** :-

- සමාස, සමාස ප්‍රයෝජන,සමාස ප්‍රභේද හා නිදසුන්, සමාස පදවල අවයව ගුරුවරයා වෙතින් ලබාගන්න.
- ක්‍රමානුකූලව කරුණු පෙළ ගස්වන්න
- විෂය කරුණු තහවුරු කරගැනීම සඳහා යෝග්‍ය ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනය කරන්න.
- ගුරුතුමාගෙන් නිර්ණායක පිළිබඳ අවබෝධයක් ලබාගන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ මැනවින් වටහාගෙන උසස් ප්‍රමිතියකින් තම පැවරුම ඉදිරිපත් කරන්න.

8. ඇගයීම් ක්‍රමය.

| අනු අංකය | නිර්ණායක / සිසුන්ගේ නම් | මාතෘකාවට අදාළ බව | තොරතුරුවල ප්‍රමාණාත්මක බව | විධිමත් බව | පැහැදිලි බව | නිර්මාණාත්මක බව | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| 2 | | | | | | | |
| 3 | | | | | | | |
| 4 | | | | | | | |
| 5 | | | | | | | |

**ලකුණු පරාසය**

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි 01